සැ. යු.- මෙවර පළවන ගැසට් පත්‍රයේ (2009.10.30) VI කොටසේ 2008.07.01 දින සිට 2009.06.30 දින දක්වා කොළඹ මහාධිකරණයේ ජූරි සභිකයින්ගේ නාමාවලිය පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,626 - 2009 ඔක්තෝබර් මස 30 වැනි සිකුරාදා - 2009.10.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 1704 | රජයේ නොවන දැන්වීම් ... ... ... | 1708 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1707 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1712 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


සැ. යු. - (i) ශ්‍රී ලංකා වෘත්තීය පත්‍ර කලාවේදීන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත 2009 මැයි 29 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) රෝහිත අබේගුණවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2009 ජුනි මස 05 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) වෙරළ ආරක්ෂක දෙපාර්තමේන්තුවක් පිහිටුවීම සඳහා වූ පනත් කෙටුම්පත 2009 ජුනි මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2009 නොවැම්බර් මස 06 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2009 ඔක්තෝබර් මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2009 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**මිනින්දෝරු දෙපාර්තමේන්තුව - ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුළියට ගැනීම - 2010

වසර දෙකක කාලයක් සඳහා පහත දැක්වෙන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුළියට ගැනීමට මිල ගණන් 2009 නොවැම්බර් මස 14 දින පස්වරු 2.00 දක්වා අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාල වලදී භාරගනු ලැබේ. ඒ සඳහා වන විස්තර සහ ඉල්ලුම්පත්‍ර කාර්යාල වේලාවන් තුළ අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයෙන් සහ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙන් ආපසු නොගෙවන රු. 250 ක මුදලක් ගෙවා 2009 නොවැම්බර් මස 13 වැනි දින ප. ව. 12.00 තෙක් ලබා ගත හැක.

**උපලේඛනය**

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය* | *අයදුම්පත් හා අනෙකුත් විස්තර ලබා ගත හැකි ස්ථාන* | *මිල ගණන් භාර ගැනීම* |
|---|---|---|---|---|
| සබරගමුව පළාත | රත්නපුරය | පැල්මඩුල්ල | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (සබරගමුව)/ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය (රත්නපුරය) | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (සබරගමුව පළාත), නව නගරය, රත්නපුරය |
| දකුණු පළාත | මාතර | අකුරැස්ස | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (දකුණු පළාත) දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය (මාතර) | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, (දකුණු පළාත) පහළ ඩික්සන් පාර, ගාල්ල |
| | | කඹුරුපිටිය | එම | එම |
| | | මාතර | එම | එම |
| | ගාල්ල | ගාල්ල | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (දකුණු පළාත)/ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, ගාල්ල | එම |
| | | හික්කඩුව | එම | එම |
| | | උඩුගම | එම | එම |
| | හම්බන්තොට | වීරකැටිය | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (දකුණු පළාත)/ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය හම්බන්තොට | |
| | | ලුණුගම්වෙහෙර | එම | එම |
| | | තිස්ස | එම | එම |
| බස්නාහිර පළාත | ගම්පහ | කැළණිය | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, (බස්නාහිර පළාත) දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, ගම්පහ | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, (බස්නාහිර පළාත) සර්වේයර් ජනරාල් කාර්යාලය, තැ. පෙ. 506, නාරාහේන්පිට කොළඹ 05 |
| | | ජාඇල | එම | එම |
| | | මීරිගම I | එම | එම |
| | | මීරිගම II | එම | එම |

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය | අයදුම්පත් හා අනෙකුත් විස්තර ලබා ගත හැකි ස්ථාන | මිළ ගණන් භාර ගැනීම |
|---|---|---|---|---|
| බස්නාහිර පළාත | ගම්පහ | වේයන්ගොඩ | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, (බස්නාහිර පළාත) දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, ගම්පහ | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, (බස්නාහිර පළාත) සර්වේයර් ජනරාල් කාර්යාලය, තැ. පෙ. 506, නාරාහේන්පිට කොළඹ 05 |
| | කළුතර | කළුතර | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (බස්නාහිර පළාත) දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය කළුතර | එම |
| | | මතුගම | එම | එම |
| | | හොරණ | එම | එම |
| | කොළඹ | මොරටුව කාර්යාල 04ක් | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (බස්නාහිර පළාත) දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය කොළඹ | එම |
| | | රත්මලාන කාර්යාල 02ක් | එම | එම |
| | | හෝමාගම කාර්යාල 02ක් | එම | එම |
| | | මහරගම | එම | එම |
| | | හංවැල්ල | එම | එම |
| ඌව පළාත | බදුල්ල | මහියංගනය | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, (ඌව පළාත) දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, බදුල්ල | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, (ඌව පළාත) පල්ලිය පාර, බදුල්ල |
| | | බණ්ඩාරවෙල | එම | එම |
| | | බදුල්ල | එම | එම |
| | මොණරාගල | බුත්තල | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, (ඌව පළාත) දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, මොණරාගල | එම |
| | | සියඹලාණ්ඩුව | එම | එම |
| උතුරු නැගෙනහිර පළාත | මඩකලපුව | මඩකලපුව | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, (උතුරු නැගෙනහිර) පළාත) දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, මඩකලපුව | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, (උතුරු නැගෙනහිර) පළාත) ත්‍රිකුණාමලය |
| | යාපනය | යාපනය | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, (උ. නැ. ප.) දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, යාපනය | එම |

කවරයේ ඉහළ වම් කෙළවරේ 'ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුළියට ගැනීම' (ස්ථාන නාමය) යනුවෙන් සඳහන් කරන ලද මිල ගණන් සපුරාලිය යුතු අවශ්‍යතා විස්තර ද සහිතව 2009.11.14 දින පස්වරු 2.00 ට පෙර ලැබෙන සේ අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම කළ හැක.

සර්වේයර් ජනරාල්,
සර්වේයර් ජනරාල් කාර්යාලය.

කොළඹ 05, කිරුළ පාර,
සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී ය.

10-995

---

**මහාධිකරණය - කොළඹ**

රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද මෝටර් වාහන ටෙන්ඩර් මගින් විකිණීම

කොළඹ මහාධිකරණ කලාපයට අයත් රාජසන්තක කරන ලද පහත සඳහන් වාහන විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවනු ලැබේ :-

| | *වාහන වර්ගය* | *වාහන අංකය* | *අදාළ අධිකරණය* | *රෙජිස්ට්‍රාර්ගේ දුරකථන අංකය* |
|---|---|---|---|---|
| 01. | මෝටර් ට්‍රයිසිකලය | ඩබ්. පී. එච්. ජී. 4778 | නුගේගොඩ මහෙස්ත්‍රාත් | |
| 02. | මෝටර් ට්‍රයිසිකලය | සොයා ගැනීමට නැත | එම | |
| 03. | මෝටර් කාර් රථය | 18-5608 | | |
| 04. | මෝටර් කාර් රථය | 19-4895 | එම | |
| 05. | මෝටර් කාර් රථය | සොයා ගැනීමට නැත | එම | 011-2852639 |
| 06. | වෑන් රථය | 59-8875 | එම | |
| 07. | වෑන් රථය | 254-1396 | එම | |
| 08. | වෑන් රථය | 54-6705 | එම | |
| 09. | වෑන් රථය | 56-4897 | එම | |
| 10. | වෑන් රථය | 253-6433 | ගල්කිස්ස මහෙස්ත්‍රාත් | |
| 11. | ලෑන්රෝවර් ජීප්රථය | 62-7485 | එම | |
| 12. | කාර් රථය | 64-9345 | එම | |
| 13. | කැබ් රථය | 250-3256 | එම | 011-2712291 |
| 14. | හොන්ඩා යතුරු පැදිය | 104-3407 | එම | |
| 15. | යතුරුපැදිය | 0040005333 | එම | |
| 16. | චැලි යතුරුපැදිය | 122-2403 | එම | |

ටෙන්ඩර් අයැදුම්පත් කොළඹ මහාධිකරණයේ ගණකාධිකාරිගෙන් ලබාගත හැක. මේ සඳහා නැවත නොගෙවන රු. 1,000 ක හා නැවත ගෙවන රු. 10,000 ක තැන්පත් මුදලක් කොළඹ මහාධිකරණයේ තැන්පත් කළ යුතුය.

ඔබගේ ඉල්ලුම්පත මුදල් තැන්පත් කළ කුවිතාන්සියේ පිටපතක් සමග 2009.11.20 වැනි දින ප. ව. 1.00 ට පෙර පහත සඳහන් ලිපිනයට තැපැල් මගින් හෝ අතින් ගෙනවිත් භාර දිය යුතුය.

සභාපති, මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව, මහාධිකරණය, කොළඹ

ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද ටෙන්ඩර් වාහන සඳහා ටෙන්ඩරය යනුවෙන් සඳහන් කළ යුතුය.

වාහන පරීක්ෂා කර බැලීම සඳහා සතියේ වැඩකරන දිනවල අදාළ අධිකරණයේ රෙජිස්ට්‍රාර්ගේ දුරකථන අංකයට අමතා වෙලාවක් වෙන්කරවා ගත හැකිය. 2009.11.20 දින ප. ව. 1.30 ට මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව ඉදිරිපිට දී ටෙන්ඩර් විවෘත කරන අතර ටෙන්ඩර් ඉල්ලුම්කරුට ජාතික හැඳුනුම්පත සමග එම අවස්ථාවට සහභාගි විය හැක.

ඔබගේ ටෙන්ඩරය පිළිගතහොත් මුළු මුදල ම එදින ගෙවා දින 02ක් තුළ වාහනය ඉවත් කරගත යුතුය.

සභාපති,
මහාධි/ප්‍රසම්පාදන කමිටු මණ්ඩලය.

2009 සැප්තැම්බර් මස 25 වැනි දින,
කොළඹ මහාධිකරණයේ දී ය.

10-927

---

# බඩු බාහිරාදිය විකිණීම්

**රත්නපුර පොලිස් කොට්ඨාසය**

පාවිච්චියට ගත නොහැකි භාණ්ඩ වෙන්දේසිය

රත්නපුර පොලිස් කොට්ඨාසයේ පොලිස් ස්ථානවල භාවිතා කරන ලද පාවිච්චියට ගත නොහැකි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම 2009 නොවැම්බර් මස 20 වැනි දින පැය 9.00 ට රත්නපුර පොලිස් අධිකාරි කාර්යාල පරිශ්‍රයේදී සිදු කෙරේ.

වෙන්දේසියට අදාළ භාණ්ඩ 2009 නොවැම්බර් මස 19 වැනි දින පැය 13.00 සිට පැය 16.00 දක්වා පරීක්ෂා කර බැලිය හැකිය.

වෙන්දේසි භූමියට ඇතුළුවන සියලු තාරාතිරමේ පුද්ගලයින් තම අනන්‍යතාවය තහවුරු කෙරෙන පරිදි ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රයක් ඉදිරිපත් කළ යුතුය.

වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ සඳහා එවලේම මුදල් ගෙවා ලදුපත් ලබා ගත යුතු අතර, එදින පැය 16.00 ට පෙර මිලදී ගත් භාණ්ඩ අදාළ පරිශ්‍රයෙන් ඉවත් කර ගත යුතුයි. එසේ ඉවත් කර නොගන්නා භාණ්ඩ පිළිබඳව වගකියනු නොලැබේ.

වෙන්දේසිය සඳහා භාණ්ඩ ඉදිරිපත් කිරීම, ලංසු තැබීම, විකිණීම, ඈවරකිරීම, සහ වෙන්දේසියෙන් ඉවත් කිරීම යන සියලුම තීරණ වෙන්දේසි මණ්ඩලය විසින් ගනු ලබයි. වෙන්දේසි මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

එල්. පී. කුලරත්න,
ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි,
රත්නපුරය.

| *අනු. අංකය* | *විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|
| 01. | අඬු | 01 |
| 02. | එකතු කිරීමේ යන්ත්‍ර | 17 |
| 03. | එලාන් ක්ලොක් | 01 |
| 04. | එනමල් කේතල | 01 |
| 05. | එනමල් සාස්පාන් | 01 |
| 06. | කුඩා බංකු | 01 |
| 07. | කතුරු | 02 |
| 08 | ප්ලාස්ටික් කෝප්ප | 02 |
| 09. | කේතල එනමල් | 07 |
| 10. | ගෑස් කුකර් | 01 |
| 11. | ගෑස් ලාම්පු | 02 |
| 12. | දුරකථන වයර්ලස් | 01 |
| 13. | බැටරි | 01 |
| 14. | කල්දේරම් කුඩා | 02 |
| 15. | වාතේ පුටු | 05 |
| 16. | ටියුබ් ලයිට් සෙට් | 03 |
| 17. | කුඩා එනමල් ජෝගු | 14 |
| 18. | ඇළුමිනියම් ජෝගු | 06 |
| 19. | රූපවාහිනී යන්ත්‍ර | 03 |
| 20. | යතුරු ලියන සිංහල | 06 |
| 21. | යතුරු ලියන ඉංග්‍රීසි | 03 |
| 22. | යතුරු ලියන දෙමළ | 01 |
| 23. | යතුරු | 22 |
| 24. | සාස්පාන් කුඩා | 01 |
| 25. | හිරමන | 04 |
| 26. | හුක් | 03 |
| 27. | හම්බෑග් | 08 |
| 28. | තේ හැඳි | 01 |
| 29. | ලොකු හැඳි | 05 |
| 30. | බත් හැඳි | 01 |

| අනු. අංකය | විස්තරය | ප්‍රමාණය |
|---|---|---|
| 31. | හදිසි ලාම්පු | 01 |
| 32. | ටියුබ් ලයිට් සෙට් | 11 |
| 33. | ටී. වී. වයර් | 30 |
| 34. | කොරොස් | 01 |
| 35. | වානේ කබඩ් | 01 |
| 36. | බණ්ඩි කියත් | 02 |
| 37. | මේස විදුලි පංකා | 04 |
| 38. | මල් බාල්දි | 06 |
| 39. | හැලජන් ලෑම්ප් | 01 |
| 40. | තේ හැඳි | 03 |
| 41. | තුවක්කු රාක්ක ඉඹි | 02 |
| 42. | පිහියා | 01 |
| 43. | පයිල් කබඩ් | 01 |
| 44. | පුටු ලෑලි | 05 |
| 45. | පාපැදි | 08 |
| 46. | කේතල් විදුලි | 06 |
| 47. | වීඩියෝ කැසට් රෙකෝඩර් | 01 |
| 48. | විදුලි පංකා බිත්ති | 01 |
| 49. | වානේ පුටු | 66 |
| 50. | වතුර ෆිල්ටර් | 10 |
| 51. | විදුලි පංකා සිවිලන් | 01 |
| 52. | වානේ රෙදි අල්මාරි | 03 |
| 53. | විදුලි පංකා සිටවන | 01 |
| 54. | විධායක පුටු | 01 |
| 55. | විදුලි පන්දම් | 11 |
| 56. | කුඩා බාල්දි | 06 |
| 57. | බොයිලේරු | 05 |
| 58. | ඇඳි බංකු | 01 |
| 59. | යකඩ ඇඳන් තනි | 20 |
| 60. | යකඩ ඇඳන් යුගල | 03 |
| 61. | ඇඳුම් රාක්ක | 03 |
| 62. | ඇඳි පුටු කෑලි | 01 |
| 63. | ලී කබඩ් (කිත් බොක්ස්) | 02 |
| 64. | ලන්තෑරුම් | 13 |
| 65. | ලී මේස | 01 |
| 66. | ලියන රාක්ක පෑන් | 01 |
| 67. | ලාම්පු | 01 |
| 68. | විදුලි කේතල් | 04 |
| 69. | සුදු බැනියම් | 27 |
| 70. | සුදු කමිස | 08 |
| 71. | සාස්පාන් කුඩා | 05 |
| 72. | සංචාරක බෑග් | 01 |
| 73. | සිවිලින් ෆෑන් | 02 |
| 74. | ඉඹි යතුරු | 62 |
| 75. | ඉලෙක්ට්‍රික් ඩ්‍රිල් | 01 |
| 76. | පිල්ටර් | 05 |
| 77. | පොරෝ තල | 05 |
| 78. | වානේ පුටු | 56 |
| 79. | මේස පිහියා | 11 |
| 80. | උදලු තල | 06 |
| 81. | ෆැක්ස් යන්ත්‍ර | 02 |
| 82. | උළු කැට | 2100 |
| 83. | බිත්ති ඔරලෝසු | 01 |
| 84. | කාකි යුනිෆෝම් රෙදි මීටර් | 600 |
| 85. | කැල්කියුලේටර් | 02 |
| 86. | හදිසි ලාම්පු | 01 |
| 87. | නිල ඇඳුම් රෙදි | 08 |
| 88. | නෑඹිලි | 03 |
| 89. | නිල ඇඳුම් පෙට්ටි | 08 |

10-980

# රජයේ නොවන දැන්වීම්

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැන්වීම

1. සමාගමේ නම : බොක්ස් - ඕ- නූඩ්ල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සමාගමේ ලියාපදිංචි අංකය : පී. වී. 68018
3. සමාගම ලියාපදිංචි කරන ලද දිනය : 2009.06.09
4. සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 7/C/51, ජයවඩනගම බත්තරමුල්ල.

ලේකම්.

10-977

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැන්වීම

1. සමාගමේ නම : කේ ෆිනෑන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සමාගමේ ලියාපදිංචි අංකය : පී. වී. 68267
3. සමාගම ලියාපදිංචි කරන ලද දිනය : 2009.06.30
4. සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 04, පාර්ක වේ, කොළඹ 05,

ලේකම්.

10-978

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9(1) වැනි වගන්තිය ප්‍රකාරව කරනු ලබන දැන්වීම

1. සමාගමේ නම : ෂිපිං ඇන්ඩ් ඒවියේෂන් ඉන්ෆොමේෂන් ඇන්ඩ් රිසර්ච් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සමාගමේ ලියාපදිංචි අංකය : පී. වී. 68428
3. සමාගම ලියාපදිංචි කරන ලද දිනය : 2009.07.14
4. සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 11, සී බීච් රෝඩ්, කොළඹ 11.

ලක්මාලි හඳුන්පතිරණ,
ලේකම්.

10-979

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ 9 වැනි වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කෙරෙන නිවේදනය

ගෝල්ඩන් ගේට් ඉන්ටර්නැෂනල් ට්‍රේඩින් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් 2009 සැප්තැම්බර් මස 23 වැනි දින ලියාපදිංචි අංක පීවී 69278 යටතේ සංස්ථාපිතයි.

ලියාපදිංචි ලිපිනය : අංක 189/2, ප්‍රධාන පාර, අත්තිඩිය. දෙහිවල.

මැග්නි කන්සල්ටන්ස් ප්‍රයිවට් ලිමිටඩ්
ලේකම්.

10-1059

---

## සමාගම් නාමය වෙනස් කිරීම පිළිබඳ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් ආඥාපනතේ වගන්ති අංක 9(2) අනුව පහත සඳහන් සමාගම සිය නාමය 2009 සැප්තැම්බර් 30 වැනි දින සිට වෙනස් කර ඇති බව දන්වා සිටිමු.

සමාගමේ කලින් නම : සිල්වරින් ෆිනෑන්ස් කම්පනි ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීබී 765
ලියාපදිංචි ලිපිනය : අංක 21, කුමාර වීදිය, මහනුවර
සමාගමේ අලුත් නම : පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් කම්පනි ලිමිටඩ්

සෙක්‍රටරීස් ඇන්ඩ් රෙජිස්ට්‍රාස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරුන්.

2009 ඔක්තෝබර් මස 6 වැනි දින.

10-959

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ "ස්පෙක්ට්‍රා ස්කිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" යන සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් වශයෙන් වර්ෂ 2009 ක් වූ සැප්තැම්බර් මස 3 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : ස්පෙක්ට්‍රා ස්කිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 69035
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක : 7, හොටෙල් පාර, ගල්කිස්ස.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව,

බ්‍රිලියන්ට් ප්‍රොමෝටර්ස් ඇන්ඩ්
කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

10-1013

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ "රෙන්බෝ කන්ස්ටක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" යන සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් වශයෙන් වර්ෂ 2009 ක් වූ ඔක්තෝබර් මස 2 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : රෙන්බෝ කන්ස්ටක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 69419
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක : 91/3, මල් පාර, වවුනියාව.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව,

බ්‍රිලියන්ට් ප්‍රොමෝටර්ස් ඇන්ඩ්
කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ලියාපදිංචි ලේකම්වරු.

10-1014

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) යටතේ නිවේදනය

**විනෝ එන්ටර්ප්‍රයිසස් ප්‍රයිවට් ලිමිටඩ්**

2009.10.07 දින අංක පී. වී. 69459 යටතේ සංස්ථාගත කරන ලදී.

ලියාපදිංචි ලිපිනය : අංක 314, 2/2, පරණ යොන් වීදිය, කොළඹ 12.

10-997

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, ජා-ඇල, කණුවන, රජමාවත, අංක 07 දරන ස්ථානයේ පදිංචි කහඳවල ආරච්චිගේ දොන් සුරේෂ් ක්‍රිස්ටෝපර් ඩිලන්ත වන මම කැබිනට් සිස්කොලිනි (CABINET CICCOLINT) විසින් වර්ෂ 2007 ක් වූ අප්‍රියෙල් මස 30 වැනි දින ලියා සහතක කරන ලද විදේශ ඇටොර්නි බලපත්‍රයෙන් සීදුව, ලියනගේමුල්ල, ලයන් සීට් හි අංක 33 දරන ස්ථානයේ පදිංචි කහඳවල ආරච්චිගේ දොන් ඇනීෂියා ගීතාංගනි දමයන්ති හට දෙන ලද ඇටෝර්නි බලපත්‍රය අවලංගු කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

මෙයට,
කහඳවල ආරච්චිගේ දොන් සුරේෂ් ක්‍රිස්ටෝපර් ඩිලන්ත.

10-976

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

තිස්සමහාරාම මහ වීදියේ පදිංචි ගුණසෝම වික්‍රමසිංහ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2009.03.03 වැනි දින ලියා සහතික කළ අංක : 2814 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් තිස්සමහාරාම ගඟසිරිපුර අංක : 468/1 යන ලිපිනයේ පදිංචි මහමඩකලපුවගේ අජිත් ගුණදර්ශන වන මා විසින් තිස්සමහාරාම දෙබරවැව කිරිඳනදි මාවතේ පදිංචි සුවන හැන්නදිගේ මහේෂ් සමීර යන අය වෙත ලබා දී ඇති ඇටෝර්නි බලපත්‍රය 2009.09.30 වැනි දින අවලංගු කරන ලද බව මෙයින් සියලු ශ්‍රී ලංකා වාසීන් වෙත සහ ශ්‍රී ලංකා ජනරජයටත් දන්වා සිටිමි.

මහමඩකලපුවගේ අජිත් ගුණදර්ශන.

10-931

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ කරනු ලබන නිවේදනය

සමාගමේ නම : පොලික්ටා පැකේජිං (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 69254
සංස්ථාගත කළ දිනය : 2009 සැප්තැම්බර් මස 22
ලියාපදිංචි ලිපිනය : අංක 5/4, හෝකන්දර දකුණ, හෝකන්දර.

10-944

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥා පනතේ 11(3) වගන්තිය ප්‍රකාර හේමාස් පවර් ලිමිටඩ් සීමාසහිත පොදු සමාගමක් බවට පත්කළ බව මින් දැනුම් දෙනු ලැබේ.

සමාගම් ආඥා පනතෙහි 8(2) වගන්තියට අනුව සමාගමේ තත්වයේ සමාගම වෙනස් කිරීම සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පැරණි නාමය : හේමාස් පවර් ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : PV415PB
සමාගමේ ලියාපදිංචි ලිපිනය : අංක 36, බ්‍රිස්ටල් වීදිය, කොළඹ 01
සමාගමේ නව නාමය : හේමාස් පවර් පී.එල්.සී.

හේමාස් පවර් පී.එල්.සී. වෙනුවෙන්.

ලේකම්වරු,
හේමාස් කෝපරේට් සර්විසර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

10-954

---

## නිවේදනයයි

ද ඩිසයින් ඩෙන් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම 2009.10.01 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ද ඩිසයින් ඩෙන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 69401
ලියාපදිංචි කාර්යාලය : අංක 142/19, දේවිකා ගාර්ඩින්ස්, පොල්හේන්ගොඩ පාර, කොළඹ 05.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝගය පරිදි,

මැනේජ්මන්ට් ඇන්ඩ් බිස්නස් ඇඩ්වයිසරි,
සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
පී. වී. 259,
සමාගම් ලේකම්වරු.

10-937

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත

පී. ඒ. මැනුෆැක්චරර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
පී.වී. 69343

ඉහත සඳහන් සමාගම 2009 සැප්තැම්බර් මස 28 වැනි දින සංස්ථාගත කළ බව සහ එහි ලියාපදිංචි කාර්යාලය අංක 481, ගාලු පාර, රාවතාවත්ත, මොරටුව ලිපිනයේ පවත්වාගෙන යන බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ මින් දැනුම් දෙමු.

බී. ඩී. ඕ බිස්කොන් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු,

2009 ඔක්තෝබර් මස 05 වැනි දින,
අංක 65/2, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත,
කොළඹ 02.
10-936

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව පහත සඳහන් සමාගම 2009 සැප්තැම්බර් මස 23 දින සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : කේ එන් කේ කාර්ට්ස් ලංකා (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී.වී. 69275
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 86, ශ්‍රී වික්‍රම මාවත, වත්තල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

බිස්නස් සොලුෂන්ස් ඇන්ඩ් සෙකට්‍රීස් (පුද්ගලික) සමාගම.

10-956

---

## සීමාසහිත සමාගමක් ස්ථාපිත කිරීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ මහජනතාව වෙත කරන නිවේදනය

සමාගමේ නම : මැඳුර ප්‍රොජෙක්ට් කන්ස්ට්‍රක්ෂන් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී.වී. 69225
ලියාපදිංචි දිනය : 2009.09.17
ලියාපදිංචි ලිපිනය : අංක 54/සී, විමුක්ති මාවත, පැලවත්ත, බත්තරමුල්ල.

10-975

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සහ සියලු දෙනාගේ ම දැනගැනීම පිණිස මෙසේ දැනුම් දෙනු ලැබේ. කඹුරුගමුව, මැදගොඩ, 'සමන්' යන ලිපිනයේ පදිංචි සමරවික්‍රම ධම්මික නයනප්‍රිය වන මා විසින් කඹුරුගමුව, මැදගොඩ පදිංචි නිරෝෂන් චමින්ද ධනපාල යන අය වෙත බලය පවරමින් ලියාපදිංචි කර ඇති ජයවීර මුහන්දිරම්ගේ ෂර්ලි සුසන්ත ජයවීර ප්‍රසිද්ධ නොතාරිස් මහතා විසින් සහතික කළ අංක 13050 සහ 2001.05.17 දිනැති ඇටෝර්නි බලපත්‍රය මෙයින් අවලංගු කර ශුන්‍ය කර බලරහිත කර සිටිමි.

මෙතැන් සිට එකී කරනු ලබන කිසිම ක්‍රියාවක් සම්බන්ධයෙන් ඇතුළත්වනු ලබන කිසිම ක්‍රියාවක් සම්බන්ධයෙන් ඇතුළත්වනු ලබන කිසිම ගිවිසුමක් පිළිබඳ මා වගකියනු නොලබන බව ද මෙයින් දැනුම් දෙමි.

10-1046

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතෙහි 91 (1) වගන්තිය ප්‍රකාරව පහත දැක්වෙන සමාගම සංස්ථාගත කිරීම සම්බන්ධයෙන් කරනු ලබන දැන්වීම

සමාගමේ නම : ජී අයිශ්වරියා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 69168
සංස්ථාගත කළ දිනය : වර්ෂ 2009 සැප්තැම්බර් මස 14
කාර්යාලය : අංක 281, ක්‍රිස්ටි පෙරේරා මාවත, (කලින් ජම්පටා වීදිය) කොළඹ 13.

මල්ලිකා සෝමසුන්දරම්,
සමාගම් ලේකම්.

10-1082

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් ආඥා පනතේ අංක 9 වගන්තිය අනුව ඉහත සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමි.

සමාගමේ නම : එන්විෂන් ජාත්‍යන්තර උසස් අධ්‍යාපන (පුද්ගලික) සමාගම
ලිපිනය : අංක 39/28, අංගම්පිටිය පාර, ඇතුල් කෝට්ටේ, කෝට්ටේ.
සමාගම් ලියාපදිංචි අංකය : පීවී 69019.

එච්. එම්. නවරත්න බණ්ඩා,
අධ්‍යක්ෂක.

10-1009

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියේ විධිවිධාන යටතේ 2009.09.28 දින පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බව දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ටික්ඇප් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 69346
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 30 වැනි මහල, බටහිර ටවර්, වර්ල්ඩ් ට්‍රේඩ් සෙන්ටර්, කොළඹ 01.

සුහයිබ් යූසුප්,
අධ්‍යක්ෂ.

10-1008

### දැන්වීමයි

2009.09.18 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ෆා ටෙක් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 69240
ලියාපදිංචි කාර්යාලය : අංක 45, අබ්දුල් හමීඩ් පාර, කොළඹ 12.

ආර්. සෙන්දිට්කුමරන්,
ලේකම්.

2009 ඔක්තෝබර් මස 12 වැනි දින.

10-982

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : COLOMBO RECORDS (PVT) LTD.
සමාගමේ ලියාපදිංචි අංකය : පී. වී. 69245
සංස්ථාගත කළ දිනය : 2009.09.18
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 67, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07.

සමාගම් ලේකම්.

10-1081

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 2400001087.
ණයකරුගේ සම්පූර්ණ නම: විදාන ගමගේ සෝමදාස සහ වාතියගේ ශාන්ති මැණිකේ

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2009.08.07 වැනි දින අංක 1614 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2009.08.07 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 228/ඒ, වලව්වත්ත, කැස්බෑව යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඒ. එස්. ලියනගේ මයා විසින් 2009.11.23 වැනි දින පෙ. ව. 11.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් අටලක්ෂ හතළිස්දහස් තුන්සිය හතළිස්එකයි ශත විස්සක (රු. 8,40,341.20) මුදලක් වර්ෂ 2009.03.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හත්ලක්ෂ හතලිස්හතරදහස් පන්සිය අසූහතරයි ශත පහක (රු. 7,44,584.05) මුදල ද, 2009.03.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් අනූපන්දහස් හත්සිය පනස්නමයයි ශත පහළොවක් (රු. 95,759.15) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් අටලක්ෂ හතළිස්දහස් තුන්සිය හතළිස්එකයි ශත විස්සක් (රු. 840,341.20) ද,

(2) එකී රුපියල් හත්ලක්ෂ හතළිස්හතරදහස් පන්සිය අසූහතරයි ශත පහක (රු. 744,584.05) මුදල මත අයවිය යුතු වර්ෂයකට 18.25% බැගින් වන පොළියක් 2009.04.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

#### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ , කොලොන්නෙ කෝරළේ දිය ඔටගම් පත්තුවේ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා සීමාවේ, උඩගම පිහිටි ගොඩඋඩවාඩිය නමැති ඉඩමට 1990.02.07 දින එෆ්. සී. පී. හෙට්ටිආරච්චි මානක තැන විසින් මැන සම්පාදිත අංක 1823/ඒ දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 25 දරන ඉඩමට මායිම් උතුරට : අඩි 20ක් පළල මාර්ග රක්ෂිතය ද, නැගෙනහිරට කැබලි අංක 24 ද, දකුණට ටී. පී. 400082 දරන රජයේ ඉඩම ද, බටහිරට : කැබලි අංක 26 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් විසි පහක (අක්. 0 රූඩ් 0 පර්. 25) වපසරියකින් යුතු මෙම ඉඩම ගොඩනැගිලි හා ඊට අයත් සියලු දේ ද මාර්ග පරවශතාවය ද සමග වේ. මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 64/287 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2009ක් වූ ඔක්තෝබර් මස 14 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

10-1094

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0400000095.

ණයකරුගේ සම්පූර්ණ නම: නිහාල් නිස්සංක පාණ්ඩි හෙට්ටිආරච්චි සහ දක්ෂිකා ප්‍රසංගි හෙට්ටිආරච්චි

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2002.11.01 වැනි දින අංක 1261 දරන රජයේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2002.11.01 වැනි දින "දිනමිණ", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 83/5, බෝමළුව පාර, වටපුළුව, මහනුවර යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය මයා විසින් 2009.11.24 වැනි දින ප. ව. 3.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ, රුපියල් හත්ලක්ෂ තිස්හත්දහස් තුන්සිය අනූදෙකයි ශත අනූවක (රු. 7,37,392.90) මුදලක් වර්ෂ 2002.05.31 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ එක්දහස් අසූහතරයි ශත හැත්තෑඅටක (රු. 2,01,084.78) මුදල ද, 2002.05.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් පන්ලක්ෂ තිස්හයදහස් තුන්සියඅටයි ශත දොළහක් (රු. 5,36,308.12) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හත්ලක්ෂ තිස්හත්දහස් තුන්සියඅනූදෙකයි ශත අනූවක් (රු. 7,37,392.90) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ එක්දහස්අසූහතරයි ශත හැත්තෑඅටක (රු. 2,01,084.78) මුදල මත අයවිය යුතු වර්ෂයකට 20.50% බැගින් වන පොළියක් 2002.06.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගතයුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර ගඟවට කෝරළේ, මහනුවර මහ නගර සභා සීමාව තුළ ඌරාවල පිහිටි සියබලන්ගේ නමැති ඉඩමට, ටී. බී. අත්තනායක මානකවරයා විසින් 1991.12.12 දින මැන සාදන ලද අංක 2577 ඒ දරන පිඹුර ප්‍රකාර, ලොට් 1 ට මායිම්, උතුරට සහ බස්නාහිරට : ඇල ද, ගිණිකොණට : වරිපනම් අංක 11 දරන ලොට් 2 ද, දකුණට : එම පිඹුරේ ම කැබලි අංක 2 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් එකොළහක් (අ. 0, රූ. 0, පර්. 11) වපසරියකින් යුතු නිවසක් සහිත ඉඩම, නුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 246/36 පත්ඉරුවෙහි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2009ක් වූ ඔක්තෝබර් මස 14 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

10-1095

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 2400000816.

ණයකරුගේ සම්පූර්ණ නම: නාගොඩ ලොකු ගමගේ චමින්ද අරුණ ශාන්ත.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2009.08.07 වැනි දින අංක 1614 දරන රජයේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2009.08.07 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 228/ඒ, වලව්වත්ත, කැස්බෑව යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඒ. එස්. ලියනගේ මයා විසින් 2009.11.26 වැනි දින පෙ. ව. 11.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ විසිපන්දහස් හයසිය විසිදෙකයි ශත පනස්අටක (රු. 3,25,622.58) මුදලක් වර්ෂ 2008.12.31 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ හැත්තෑහයදහස් හාරසියහැටතුනයි ශත හැත්තෑහතරක (රු. 2,76,463.74) මුදල ද, 2008.12.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් හතළිස්අටදහස් තුන්සියඅනූපහයි ශත අසූහතරක් (රු. 48,395.84) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තුන්ලක්ෂ විසිපන්දහස් හයසියවිසිදෙකයි ශත පනස්අටක් (රු. 3,25,622.58) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ හැත්තෑහයදහස් හාරසියහැටතුනයි ශත හැත්තෑ හතරක (රු. 2,76,463.74) මුදල මත අයවිය යුතු වර්ෂයකට

20.00% බැගින් වන පොළියක් 2009.01.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ , මැද කෝරළේ හෙලඋඩ පළාතේ පල්ලේවෙල ග්‍රාමයේ බලන්ගොඩ වෝඩ් අංක 8 වෙට්නෝල් පාරේ වරිපනම් අංක 90/10 ඒ හි පිහිටි දෙල්ගහ කනත්ත නමැති ඉඩමට 1994.07.30 වැනි දින ඩබ්. එම්. ජිනදාස බලයලත් මානක තැන විසින් මැන සම්පාදිත අංක 987 පිඹුර ප්‍රකාර ලොට් 1 ට මායිම්, උතුරට ඩී. ජේ. හෙට්ටිආරච්චි බලයලත් මානක තැන විසින් මැන සම්පාදිත අංක 1033 පිඹුරේ ලොට් 12 හි ඉතිරි කොටස ද, නැගෙනහිරට : පාර (1033 පිඹුරේ ලොට් 13) ද දකුණට : 1033 පිඹුරේ ලොට් 12 හි ඉතිරි කොටස නොහොත් ඩබ්. එම්. ජිනදාස බලයලත් මානක තැන විසින් මැන සම්පාදිත අංක 980 පිඹුරේ ලොට් 1 ද, බටහිරට : දෙල්ගහ හේන ද, යන මායිම් තුළ පිහිටි පර්චස් දාහතරයි දශම හයක් (අක්. 0, රූඩ් 0, පර්. 14.6) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද මාර්ග පරවශතාවය ද සමග රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 174/259 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2009ක් වූ ඔක්තෝබර් මස 14 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂක මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

10-1096

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - ඇල්පිටිය ශාඛාව
## (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගාල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. එස්. මරික්කාර් විසින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට 2001.1017 වැනි දින ලියා සහතික කරන ලද අංක 8588 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගොඩකන්ද කංකානමගේ කරුණාසේන යන අය බන්ධනදායී ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොළිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලු මුදල් ප්‍රමාණයන් ද (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇත්තාවූ ද දේපළ වර්ෂ 2009.11.16 වැනි දින පෙ.ව. 11.30 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.09.03 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* සහ 2009.09.08 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පත්‍රවල පළ වී ඇත.

උපලේඛනය

දකුණු පළාතේ ගාල්ල දිස්ත්‍රික්කයේ කරන්දෙනිය ප්‍රාදේශීය සභා උප කාර්යාලයේ සීමාව තුළ පතවැලිවිටිය ගමෙහි දෙහිදහඅටකැලේ නමැති ඉඩමට සර්වේ ජනරාල් තැන විසින් සාදන ලද එල්. ඩී. ඕ එච් 12/151 දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද ලොට් අංක 778 දරන කොටස, ප්‍රමාණය : පර්චස් විසිහයයි දශම අටයි පහක්. (අ. 0, රූ. 0, පර්. 26.85)

*පිවිසීම.-* ඇල්පිටිය ප්‍රධාන බස් නැවතුමේ සිට (කහදූව හරහා) මාපලගම මාර්ගයේ සැතපුම් 8 ක් පමණ ගමන් කිරීමේ දී හමුවන රූකඩහේන නිවාස යෝජනා ක්‍රමය හන්දියෙන් දකුණට හැරී පතවැලිවිටිය පාරේ සැතපුම් 1 1/2 ක් ගමන් කිරීමේ දී දකුණු අත පැත්තේ මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) ක්,
2. ප්‍රාදේශීය සභා බදු සියයට එකක් (1%) ක්,
3. සියලුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් (ගැණුම් මිලෙන් 2.5%),
5. විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූවක් (90%) විකිණීමේ දින සිට දින 30 ක් ඇතළත හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ආයතනයට ගෙවිය යුතු අතර, එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වනවිට ගෙවා ඇති මුදල් ආපසු නොගෙවන අතර, එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෝෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක 2661826 ලබාගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99 උසාවිය පාර, කොළඹ 12.
දුරකථන අංකය : 071-4175944.

10-1067

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - අම්බලන්ගොඩ ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

අම්බලන්ගොඩ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්. ඕ. ඒ. ද සිල්වා විසින් 2005.05.31 වන දින හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියා සහතික කරන ලද අංක 1437 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ඉලන්දාරි දේව මාටින් සහ ඉලන්දාරි දේව චමින්ද සිරිනන්ද යන අයවළුන් බන්ධනදායී ණයකරුවන් හැටියට පැහැරහැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොළිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලු මුදල් අයකර ගැනීම සඳහා ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව මෙහි පහත උපලේඛනයෙහි විස්තර කර ඇත්තා වූ දේපළ වර්ෂ 2009 ක් වූ නොවැම්බර් මස 25 වැනි දින ප.ව. 2.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.09.03 වැනි දින ගැසට් පත්‍රයේ සහ 2009.09.09 වැනි දින අයිලන්ඩ්, දිවයින සහ තිනකරන් පත්‍රවල පළවී ඇත.

### උපලේඛනය

දකුණු පළාතේ, ගාලු දිස්ත්‍රික්කයේ, වැල්ලබඩ පත්තුවේ කරන්දෙනිය *ඊඩන් එස්ටේට් නොහොත් ඊඩන්වත්ත නොහොත් දෙඹරගොඩකැලේ නොහොත් ගම්මිරිස්වත්ත* නමැති ඉඩමට බලයලත් මානක ටී. බී. ඒ. ද සිල්වා විසින් 1982.02.25 වැනි දින මැන සාදන ලද අංක 1440 දරන පිඹුරෙහි ලොට් අංක 2 දරන කොටස, (ප්‍රමාණය : අක්කර එකයි, පර්චස් හයයි - (අ 1, රූ. 0, පර්. 6) සහ එම පිඹුරෙහි ලොට් අංක 3 ඒ සහ 3 බී දරන බිම් කොටස්, (ප්‍රමාණය : රූඩ් දෙකක් (අ. 0, රූ. 2, පර්. 0) මාර්ග අයිතිය සමග දේපළට පිවිසීම අම්බලන්ගොඩ සිට ඇල්පිටිය පාරේ සැතපුම් 3 පමණ ගමන් කිරීමේ දී හමුවන කරාවේ හන්දියෙන් වමට හැරී පහළ පාර උණගස්විල හන්දිය මාර්ගයේ සැතපුම් 2 1/2 පමණ නැවත ගමන් කිරීමේදී හමුවන දෙඹරගොඩ හන්දියෙන් වමට හැරී බොරළුපාරේ යාර 400 ක් පමණ ගමන්කොට දකුණට හැරී සැතපුම් 3/4 පමණ ගමන් ගන්නා විට මෙම දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. ප්‍රාදේශීය සභා බදු සියයට එකක් (1%),
3. සියලුම ප්‍රචාරක ගාස්තු,
4. වෙන්දේසිකරුගේ වෘත්තීය ගාස්තු (ගැණුම් මිලෙන් 2.5%),
5. මුද්දර ගාස්තු,
6. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු,
7. ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූවක් (90%) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. ආයතනයට ගෙවිය යුතු අතර, එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වනවිට ගෙවා ඇති මුදල් අහිමි කිරීමට සහ එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු, (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී.එල්සී., අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංකය : 2661826 යෙන් ලබාගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස්, බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර, කොළඹ 12.
දුරකථන අංකය : 071-4175944.

10-1066

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - පානදුර ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවන් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට 2007.12.05 වැනි දින ලියා සහතික කරන ලද අංක 2194 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, ජය මරක්කල විදානෙලාගේ ප්‍රියන්ත මාකස් ප්‍රනාන්දු යන අය බන්ධනදායී ණයකරු හැටියට පැහැරහැර ඇති හෙයින්, එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොළිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලු මුදල් ප්‍රමාණයන් ද (තදන්නතරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල අඩුකොට) අයකර ගැනීම සඳහා ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව පහත විස්තර කර ඇත්තාවූ ද දේපළ වර්ෂ 2009 ක් වූ නොවැම්බර් මස 23 වැනි දින පෙ.ව. 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ කළුතර දිස්ත්‍රික්කයේ තොටමුණ පානදුර, තල්පිටි දෙබැද්දේ පානදුර ප්‍රාදේශීය සභා සීමාව තුළ තන්තිරිමුල්ල උප කාර්යාල සීමාව තුළ මාලමුල්ලේ කහටගහවත්ත නමැති ඉඩමේ නිරිතදිග කොටසට බලයලත් මානක පී. මාලේවන විසින් මැන සාදන ලද අංක 817 සහ 1996.09.03 වැනි දින මැන සාදන ලද පිඹුරේ බෙදා වෙන් කරන ලද ලොට් අංක බී2එක්ස් දරන කොටස, ප්‍රමාණය : පර්චස් තිස්හයයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 36.5)

*පිවිසීම.-* පානදුර රජයේ රෝහල් හන්දියේ සිට සිරිල් ජැන්ස් පාරේ හිරණ හරහා දිවෙන ප්‍රධාන මාර්ගයේ මීටර් 600 ක් පමණ ගමන් කොට දකුණට හැරී යන මාලමුල්ල ප්‍රධාන මාර්ගයේ කි. මී. 1.7ක් පමණ ගමන් කොට දකුණට හැරී යන රණවිරු හේමන්ත පෙරේරා මාවතේ මීටර් 350 ක් පමණ ගමන් කොට පන්සල ලඟින් හැරී අඩි 10 ක් පමණ පළල පාරේ මීටර් 75 ක් පමණ ගමන් කිරීමේ දී වම් අත පැත්තේ මෙම දේපළ පිහිටා ඇත.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.08.28 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* සහ 2009.09.03 වැනි දින අයිලන්ඩ් දිවයින සහ තිනකරන් පත්‍රවල පළවී ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් කල යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ :-

(i) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
(ii) ප්‍රාදේශීය සභා බදු සියයට එකක් (1%),
(iii) සියළුම ප්‍රචාරක වියදම්,
(iv) වෙන්දේසිකරුගේ වෘත්තිය ගාස්තු (ගැණුම් මිලෙන් 2.5%),
(v) මුද්දර ගාස්තු,
(vi) විකුණුම් කොන්දේසි පිළියෙල කිරීමේ හා නොතාරිස් ගාස්තු,
(vii) ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූවක් (90%) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ආයතනයට ගෙවිය යුතු අතර, එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වනවිට ගෙවා ඇති මුදල් අහිමි කිරීමට සහ එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු, (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී.එල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක 2661826 යෙන් ලබාගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර, කොළඹ 12,
දුරකථන අංක : 071-4175944.

10-1065

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - ගම්පහ ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් 2007.05.29 වැනි දින හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී නමට ලියා සහතික කරන ලද අංක 6135 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ගජ ලංකා පෘට්ස් ඇන්ඩ් ෆූඩ්ස් (ප්‍රයිවට් ලිමිටඩ්) යන අය බන්ධනදායී ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොළිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියලු මුදල් අයකර ගැනීම සඳහා, ඉහත කී හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව මෙහි පහත උපලේඛනයෙහි විස්තර කර ඇත්තාවූ දේපළ වර්ෂ 2009 ක් වූ නොවැම්බර් මස 21 වැනි දින ප.ව. 2.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.09.03 වැනි දින *ගැසට් පත්‍රයේ* සහ 2009.09.07 වැනි දින අයිලන්ඩ් දිවයින සහ තිනකරන් පත්‍රවල පළවී ඇත.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාවේ ඔයබද්දේපෙරුව උප කාර්යාල සීමාවේ තිහාරිය රොස්මීර් එස්ටේට් නමැති ඉඩමට බලයලත් මානක යූ. එම්. ආරියසේන විසින් මැන සාදන ලද 2007.05.25 වැනි දින අංක 1728 ඒ පිඹුරෙහි ලොට් අංක ඒ දරන කොටස, ප්‍රමාණය රූඩ් තුනයි පර්චස් දහසයයි දශම හයයි පහක් (අ. 0, රූ. 3, පර්. 16.65) (හෙක්. 0.3456)

*දේපළට පිවිසීම.-* කොළඹ-නුවර ප්‍රධාන මාර්ගයේ තිහාරිය හන්දියේ සිට කුරුඳුවත්ත පාරේ කලගෙඩිහේන මහා විද්‍යාලය පසුකොට කෙටිදුරක් ගමන් කිරීමේ දී හමුවන නව සණස වෙළඳ සංකීර්ණයට ආසන්නව (නුවර පාරේ සිට මීටර් 75 ක් පමණ ආසන්නව) කුරුඳුවත්ත පාරේ දකුණු පසට මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් කල යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ :

(i) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) ක්,
(ii) ප්‍රාදේශීය සභා බදු සියයට එකක් (1%) ක්,
(iii) සියළුම ප්‍රචාරක වියදම්,
(iv) වෙන්දේසිකරගේ වෘත්තීය වියදම් ගාස්තු (ගැණුම් මිලෙන් 2.5%),
(v) විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු,
(vi) ලිපිකරු හා සෝෂක ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූවක් (90%) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ආයතනයට ගෙවිය යුතු අතර, එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් අහිමි කිරීමට සහ එම දේපළ නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු, (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී.එල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක 2664664යෙන් ලබාගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99, උසාවිය පාර, කොළඹ 12.
දුරකථන අංක : 071-4175944.

10-1064

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 2200000395.
ණයකරුගේ සම්පූර්ණ නම: වනසිංහ මුදියන්සේලාගේ ධර්මපාල.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබූ වර්ෂ 2007.11.16 වැනි දින අංක 1524 දරන රජයේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2007.11.23 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 220/5, ගම්පහ පාර, යක්කල යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඩබ්ලිව්. එම්. වික්‍රමරත්න මයා විසින් 2009.11.30 වැනි දින පෙ. ව. 11.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ පනස්හත්දහස් හයසිය පනස් අටයි ශත තිස්තුනක (රු. 257,658.33) මුදලක් වර්ෂ 2007.04.30 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ පනස්දහස් අටසිය හතළිස්දෙකයි ශත හතළිස් එකක (රු. 150,842.41) මුදල ද, 2007.04.30 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් එක්ලක්ෂ හයදහස් අටසිය පහළොවයි ශත අනූදෙකක් (රු. 106,815.92) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ පනස්හත්දහස් හයසිය පනස් අටයි ශත තිස්තුනක් (රු. 257,658.33) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ පනස්දහස් අටසිය හතළිස්දෙකයි ශත හතළිස් එකක (රු. 150,842.41) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.00% බැගින් වන පොලියක් 2007.05.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### උපලේඛනය

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල උප දිසාපති කොට්ඨාසයේ, නිකවැව ග්‍රාමයෙහි පිහිටි ඉඩමට 1990 අප්‍රේල්, අගෝස්තු 1990.01.15 දිනයන්හි මිනුම්පති විසින් මැන සම්පාදිත අංක 12 වී පිඹුර ප්‍රකාර ඉඩමට ලොට් 4 1/2 ට මායිම් උතුරට : ලොට් 2 ලෙස ලකුණු කරන ලද ඉඩම ද, නැගෙනහිරට : මාර්ග රක්ෂිතය ද, දකුණට : ලොට් 4 2/2 ද, බටහිරට : ලොට් 01 සහ 06 ලෙස ලකුණු කරන ලද ඉඩම ද, යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් හයයි දශම නවයයි හතක් (අක්. 0 රූඩ් 2, පර්. 6.97) හෝ හෙක්ටයාර් 0.220 වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේ ද මාර්ග පරවශතාවය ද සමග මොණරාගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ LDO/M16/17 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2009ක් වූ ඔක්තෝබර් මස 14 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

10-1097

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 1804400119.
ණයකරුගේ සම්පූර්ණ නම: ජයතිලක හිටිහාමි මුදියන්සේලාගේ මහින්ද හේරත් ජයතිලක.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබූ වර්ෂ 2005.06.03 වැනි දින අංක 1396 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2005.06.24 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුව ද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකරගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 28, නව කාර්යාල සංකීර්ණය, කුමාරතුංග මාවත, කුරුණෑගල යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඩබ්ලිව්. එම්. අයි. ගල්ලැල්ල මයා විසින් 2009.11.25 වැනි දින පෙ. ව. 11.30 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ තිස්හත්දහස් හාරසිය හැටතුනයි ශත දොළහක (රු. 137,463.12) මුදලක් වර්ෂ 2002.12.31 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් අනූනමදහස් හයසිය අනූතුනයි ශත පනස්දෙකක (රු. 99,693.52) මුදල ද, 2002.12.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් තිස්හත්දහස් හත්සිය හැටනමයයි ශත හැටක් (රු. 37,769.60) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ තිස්හත්දහස් හාරසිය හැටතුනයි ශත දොළහක් (රු. 137,463.12) ද,

(2) එකී රුපියල් අනූනමදහස් හයසිය අනූතුනයි ශත පනස්දෙකක් (රු. 99,693.52) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.50% බැගින් වන පොළියක් 2003.01.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකරගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද, ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙනි හත්පත්තුවේ රුකොපත්තු කෝරළයේ පොල්ගහවෙල ප්‍රාදේශීය සභා සීමාවේ වෙලගෙදර පිහිටි ජම්බුගහමුලවත්ත ඉඩමට 1984.12.27 වැනි දින එස්. කේ. තැන්නේගෙදර මානකගේ අංක 462/84 පිඹුර ප්‍රකාර කැබැලි අංක 3 මායිම්, උතුරට : එස්. එම්. කුමාරිහාමිට අයත් ඉඩම් සහ පැල ඉණි වැට ද, නැගෙනහිරට ජේ. එච්. හීන්බණ්ඩාට සහ එච්. එම්. චන්ද්‍රාවතීට හිමි ඉඩම් සහ පැල ඉනි වැට ද, දකුණට : එච්. එම්. චන්ද්‍රාවතීට සහ ජේ. එම්. කේ. බණ්ඩාට හිමි ඉඩම් සහ පැල ඉනිවැට ද, බස්නාහිරට : කැබැලි අංක 1 සහ 2 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් තිස්පහක් (අක්. 0 රූ. 0 පර්. 35) විශාල ඉඩම වේ. මෙය ඒ තුළ පිහිටි සෑම සහ මාර්ග පරවශතාවය ද සමග කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එෆ්. 905/76 246 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2009ක් වූ ඔක්තෝබර් මස 14 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

10-1098

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

#### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 6/39974/එල්6/666.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2005.07.15 ගැසට් පත්‍රයේ සහ 2006.06.20 වැනි දින දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොළිය ද, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පානදුර, ඩයස් ගොඩනැගිල්ල, හි බලයලත් වෙන්දේසිකාර එච්. ජී. පෙරේරා මයා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2009.11.27 වැනි දින පස්වරු 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ, බණ්ඩාරගම ප්‍රාදේශීය සභා සීමාව තුළ (මුත්වත්ත බටහිර උප කාර්යාලය) රන්මිනිකේ පිහිටි මුණසිංහෙවත්ත හෙවත් මහගෙදරවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු සී. වික්‍රමගේ විසින් සකසන ලද 1999.09.13 වැනි දිනැති හා අංක 4013 දරන පිඹුරේ කැබලි අංක 4 ඒ ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ.01, පර්. 13.73 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඊට අයිති සියලුම දේත් සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 ඔක්තෝබර් මස 15 වැනි දින.
අංක 269, ගාලු පාර, කොළඹ 03,

10-1003/10

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

#### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 6/46190/එෆ්6/221.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004.12.10 ගැසට් පත්‍රයේ සහ 2005.06.06 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවා වූ ද යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොළිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පානදුර, ඩයස් ගොඩනැගිල්ල, හි බලයලත් වෙන්දේසිකාර එච්. ජී. පෙරේරා මයා විසින් එම දේපළ පිහිටි ස්ථානයේදී 2009.11.27 වැනි දින පස්වරු 4.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුනේ වාද්දුව වස්කඩු දෙබැද්දේ කළුතර ප්‍රාදේශීය සභා සීමාවන් තුළ රන්නුන්ගල පිහිටි හේනේවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඩබ්. ඒ. ආරියරත්න විසින් සකසන ලද 1995.11.18 දිනැති හා අංක 756 දරන පිඹුරේ කැබලි අංක 9 ලෙස දැක්වෙන

ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 10 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ.

මෙම ඉඩම් කොටස පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 97/227 යටතේ ලියාපදිංචි කොට ඇත.

තව ද ඉහත අංක 756 දරන පිඹුරේ කැබලි අංක 11 මතින් ඇති මාර්ග අයිතිය ද සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

අංක 269, ගාලු පාර,
කොළඹ 03,
2009 ඔක්තෝබර් මස 15 වැනි දින.

10-1003/9

---

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

**1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම**

ණය අංකය : 18/63649/වයි18/474

1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2001.06.15 *ගැසට් පත්‍රයේ* සහ 2001.10.29 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අය කර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය මීගමුව, ප්‍රනාන්දු ඇවනිව්, අංක 22 හි බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා විසින් එම දේපළ පිහිටි ස්ථානයේදී 2009.11.25 වැනි දින පස්වරු 4.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

කුරුණෑගල දිස්ත්‍රික්කයේ කුලියාපිටිය ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ සඳලංකාව ග්‍රාමයේ පිහිටි දෙල්ගහඅගාරෙවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු වයි. එම්. ආර්. යාපා විසින් සැකසුණු 1994.01.05 දින හා අංක 3503 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0 රූ. 0 පර්. 15 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ.

මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එස් 55/119 යටතේ ලියාපදිංචි කොට ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

අංක 269, ගාලු පාර,
කොළඹ 03,
2009 ඔක්තෝබර් මස 15 වැනි දින.

10-1003/8

---

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

**1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම**

ණය අංකය : 2/67206/ඊ2/341.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2003.10.31 *ගැසට් පත්‍රයේ* සහ 2004.05.29 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය මීගමුව, ප්‍රනාන්දු ඇවනිව්, අංක 22 හි බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2009.11.25 වැනි දින පෙරවරු 11.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

ගම්පහ දිස්ත්‍රික්කයේ බලබෝව පිහිටි අඹගහවත්ත නොහොත් හපුගේ පිල්ලෑව නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. පී. වික්‍රමසිංහ විසින් සැකසුණු 1997.02.11, 1999.01.05 වැනි දින හා අංක 352/97 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 1 ඒ ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0 රූ. 1 පර්. 0 ක් වූ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

අංක 269, ගාලු පාර,
කොළඹ 03,
2009 ඔක්තෝබර් මස 15 වැනි දින.

10-1003/7

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 1/42476/සීඩී6/702.

1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2004.06.25 දින *ගැසට් පත්‍රයේ* සහ 2004.11.13 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූද යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අය කර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක විසින් එම දේපළ පිහිටි ස්ථානයේදී 2009.11.26 වැනි දින පෙරවරු 11.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ වටරප්පොල පාර, අංක 23/19 හි පිහිටි කිරිපැල්ලගහවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජේ. එම්. ඩබ්. සමරනායක විසින් මැන සාදන ලද 2000.06.13 දිනැති හා අංක 1213 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 2 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ.0 රූ. 01 පර්. 3.67 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ.

මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක එම් 2030/9 හි ලියාපදිංචි වී ඇත.

තවද පිඹුරු අංක 2482හි කැබලි අංක 5 මතින් වැටී ඇති මාර්ග අයිතිය ද සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

අංක 269, ගාලු පාර,
කොළඹ 03,
2009 ඔක්තෝබර් මස 15 වැනි දින.

10-1003/6

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 2/52092/එච්2/761.

1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2000.12.01 *ගැසට් පත්‍රයේ* සහ 2001.05.09 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අය කර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ හා භූමිය පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2009.11.30 වෙනි දින පස්වරු 2.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්ගම - බෝගමුව පිහිටි කිතනගහලන්ද හෙවත් ඇස්මොරලන්ද වතුයාය නම් වූ ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සාදන ලද 1990.05.16 දින හා අංක 4606 ඒ දරන මිණුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0 රූ. 1 පර්. 16.5 ක් වූ බෙදා වෙන් කරන ලද මුළු බිම් කොටස වේ.

මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක ඊ 355/250 හි ලියාපදිංචි වී ඇත.

තව ද බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් සැකසුනු 1989.04.04 දිනැති අංක 4030 දරන පිඹුරේ කැබලි අංක සී සහ ඩී මතින් හිමි මාර්ග අයිතිය ද සමග එකී අංක 4606 ඒ පිඹුරේ දක්වා ඇති මාර්ග අයිතිය ද සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

අංක 269, ගාලු පාර,
කොළඹ 03,
2009 ඔක්තෝබර් මස 15 වැනි දින.

10-1003/5

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 1/10200/සීඑම්6/566,1/34770/සීඩී3/178

1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2000.03.16 *ගැසට් පත්‍රයේ* සහ 2009.02.09 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොළිය වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය මීගමුව, ප්‍රනාන්දු ඇවනිව්, අංක 22හි බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2009.11.30 වෙනි දින පෙරවරු 10.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ නගර සභා සීමාව තුළ බොරැල්ලේ පිහිටියාවූ ද, ෆෙයාර්ෆීල්ඩ් ගාර්ඩින් හි වරිපනම් අංක 11 දරන ඉඩම, බලයලත් මිනින්දෝරු එස්. ලෝකනාථ විසින් සැකසුණු 1986.07.28 වැනි දින හා අංක 3403/ඒබී පිඹුරේ කැබලි අංක බී ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 20 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි අනෙකුත් දේත් සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

අංක 269, ගාලු පාර,
කොළඹ 03,
2009 ඔක්තෝබර් මස 15 වැනි දින.

10-1003/4

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 6/30879/වී6/425, 6/33839/පී6/006.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2003.04.25 ගැසට් පත්‍රයේ සහ 2003.12.18 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොළිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අය කර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2009.11.26 වැනි දින පස්වරු 4.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ දෙසස්ත්‍රා කළුතර හි පිහිටි කිරිමැටියෙකුරුඳුවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු වයි. පී. ද සිල්වා විසින් සැකසුණු 1996.01.26 දිනැති හා අංක 675බී දරන මිණුම් පිඹුරේ කැබලි අංක 71 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ,0. පර්. 10 ක් වූ බෙදා වෙන් කළ මුළු බිම් කොටස මාර්ග අයිතිය ද සමග වේ.

මෙම ඉඩම් කොටස කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම පත් අංක ජී 145/246 යටතේ ලියාපදිංචි කොට ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

අංක 269, ගාලු පාර,
කොළඹ 03,
2009 ඔක්තෝබර් මස 15 වැනි දින.

10-1003/3

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 1/35530/සීඩී4/024

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය හා උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2008.01.16 ගැසට් පත්‍රයේ සහ 2009.03.30 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොළිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2009.11.26 වැනි දින පෙරවරු 9.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාවේ අබේසේකර පාර පිහිටි මුළුවක්කඩකුඹුර නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු වී. පී. සමරවීර විසින් සැකසුණු 1994.05.02 වැනි දින හා අංක 2357 ඒ දරන මිණුම් පිඹුරේ බෙදා වෙන් කරන ලද ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 13.18 ක් වූ බිම් කොටස වේ.

මෙම ඉඩම් කොටස දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්‍රිරු අංක එම් 2032/91 යටතේ ලියාපදිංචි කොට ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

අංක 269, ගාලු පාර,
කොළඹ 03,
2009 ඔක්තෝබර් මස 15 වැනි දින.

10-1003/2

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 1/30903/සීඩී4/362

1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2001.09.28 ගැසට් පත්‍රයේ සහ 2002.05.28 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා

විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අය කර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක විසින් එම දේපළ පිහිටි ස්ථානයේදී 2009.11.26 වැනි දින පස්වරු 1.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

## උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාවන් තුළ දෙහිවල නැගෙනහිර දෙහිවල කොට්ඨාස අංක 9 (දෙහිවල ලියාපදිංචි පිඹුරු අංක 1 හි දැක්වෙන) දෙහිවල, ඇලන් මාවතේ, වරිපනම් අංක 54 දරන ස්ථානයේ පිහිටි අඹගහවත්ත නම් වූ ඉඩමේ බලයලත් මිනින්දෝරු අයි. එම්. සී. ප්‍රනාන්දු විසින් සැකසුණු 1995.04.30 වෙනි දින හා අංක 1395 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 3290 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 9.74 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ.

මෙම ඉඩම් කොටස දෙහිවල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක 82/102 යටතේ ලියාපදිංචි කර ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

අංක 269, ගාලු පාර, කොළඹ 03,
2009 ඔක්තෝබර් මස 15 වැනි දින.

10-1003/1

---

## රාජ්‍ය උකස් හා අයෝජන බැංකුව

### 1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 2/66018/ඊ2/122.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2001.06.22 *ගැසට් පත්‍රයේ* සහ 2001.11.12 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අය කර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපල හා භූමිය මීගමුව, ප්‍රනාන්දු ඇවනිව්, අංක 22 හි බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා විසින් එම දේපළ පිහිටි ස්ථානයේදී 2009.11.25 වැනි දින පෙරවරු 9.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

## උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ ජා ඇල ප්‍රාදේශීය සභා සීමාවන් තුළ ඒකල, කුරුඳුවත්ත, රජ මාවත, වරිපනම් අංක 133/4 දරන ස්ථානයේ පිහිටි ගාල්ලවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. ඒ. ජේ. බී. පෙරේරා විසින් සැකසුණු 1998.04.01 වෙනි දින හා අංක 5405 දරන මිණුම් පිඹුරේ කැබලි අංක බී ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 12.77 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ.

මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක බී 147/08 හි ලියාපදිංචි වී ඇත.

තවද ඉහත අංක 5405 දරන පිඹුරේ වෙන් කරන ලද (අඩි 8 ක් පළල) පාර ද සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 ඔක්තෝබර් මස 15 වැනි දින,
අංක 269, ගාලු පාර, කොළඹ 03.

10-1002/10

---

## හැටන් නැෂනල් බැංක් පී.එල්.සී. -හල්ව්ස්ඩෝර්ප් ශාඛාව
### (කලින් සීමා සහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්.එස්. හල්ඔලුව විසින් සහතික කරන ලද්දාවූ හැටන් නැෂනල් බැංක් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ 2006.08.15 දින සහ අංක 1725 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම මාකේවිටගේ ජෝෂප් බෙනඩික් ලක්ෂ්මන් පෙරේරා ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැංක් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරු ගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල එම දේපල පිහිටි ස්ථානයේදී 2009 ක් වූ නොවැම්බර් මස 20 වන දින ප.ව. 3.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපල*.-බස්නාහිර පළාතේ(කොළඹ ලියාපදිංචි කොට්ඨාසය තුළ) ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ වත්තල ප්‍රාදේශීය සභා සීමාව තුළ හැඳල උප කාර්යාලයේ තිඹිරිගස්යාය, බලගල පාර තුළ, පිහිටි වරිපනම් අංක 46 දරන 'තිඹිරිගහවත්ත' නමැති පර්. 22 ක්වූ ඉඩම් කොටස.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2009.10.02 වන දින රජයේ *ගැසට් පත්‍රය* හා 2009.10.05 වැනි දින දිවයින, ද අයිලන්ඩ් සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම*.- කොළඹ -මීගමුව මහා මාර්ගයේ වත්තල හැඳල හන්දියෙන් බලගල පාර දෙසට හැරී කිලෝමීටර් 2.6 ක් පමණ ගිය විට,

අදාල විෂය වස්තුව (තිඹිරිගහවත්ත) හමුවේ. ඇලකන්ද හන්දියෙන් මීටර් 225 ක් ගොසින් ද මෙම ඉඩමට ළඟාවිය හැක.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක්(1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු.2000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු. 500) ක්ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත ගෙවිය යුතුය. දින 30 ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු සහ ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පි.එල්.සී. අංක 479, ටි. බී. ජයා මාවත, කොළඹ 10, (දුරකථන අංකය 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

අංක 56, 'ශින් ක්යෝකුෂින්',
කටුවාවල පාර,
බොරලැස්ගමුව.
දුරකථන අංක : 0112-509442
0777-378441
0714-424478
ෆැක්ස් අංකය : 0114-617059

10-989

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0100007464.
ණයකරුගේ සම්පූර්ණ නම : බාලගේ දොන් අජිත් රොහාන් විරසූරිය.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2009.06.26 වන දින අංක 1608 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2009.07.31 වන දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනකුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 220/5, ගම්පහ පාර, යක්කල යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඩබ්ලිව්. එම්. වික්‍රමරත්න විසින් 2009.11.16 වන දින පෙ.ව. 10.30 ට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් එකොළොස් ලක්ෂ අසූපන්දහස් හාරසිය අසූදෙකයි ශත අනූදෙකක (රු.1,185,482.92) මුදලක් වර්ෂ 2008.12.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් නමලක්ෂ අසූඑක්දහස් හාරසිය විසිපහයි ශත අනූපහක (රු.981,425.95) මුදල ද, 2008.12.31 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් දෙලක්ෂ හාරදහස් පනස්හයයි ශත අනූහතක් (රු.204,056.97)ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එකොළොස් ලක්ෂ අසූපන්දහස් හාරසි අසූදෙකයි ශත අනූදෙකක් (රු. 1,185,482.92)

(2) එකී රුපියල් නමලක්ෂ අසූඑක්දහස් හරසිය විසිපහයි ශත අනූපහක (රු.981,425.95) මුදල මත අයවිය යුතු වර්ෂයකට 18.90 % බැගින් වන පොලියක් 2009.01.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට,

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ (මාකොළ උප කාර්යාලය) බියගම ප්‍රාදේශීය සභා සීමාවේ හෙයියන්තුඩුව ග්‍රාමයෙහි ඇටඹගහලන්ද නමැති ඉඩමට 2003.11.29 දින ලෙස්ලි එම්. ප්‍රනාන්දු මානක තැන විසින් මැන සම්පාදිත අංක 1842 පිඹුර ප්‍රකාර කැබලි අංක A2 ට මායිම්, උතුරට : කැබලි අංක A1 ඇවරිවත්ත පාර ද, නැගෙනහිරට පිඹුරු අංක 774 හි කැබලි අංක 82 ද, දකුණට වෙළුන් අප්පුහාමිගේ උරුමකරුවන්ට අයිති ඉඩම ද, බටහිරට : පිඹුරු අංක 774 හි කැබලි අංක 84, 85, සහ 86 සහ කැබලි අංක A1 ද, යන මායිම් තුල පිහිටි පර්චස් දහඅටක (අක්. 0, රූඩ්. 0. පර්. 18) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේද මාර්ග පරවශ්‍යතාවයද සමග වේ. ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C669/237 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

වර්ෂ 2009 ක් වූ ඔක්තෝබර් මස 14 වැනි දින කොළඹ දී ය.

සාමාන්‍යාධිකාරී.

10-1090

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0200001297.

ණයකරුගේ සම්පූර්ණ නම : දෙලන්කගේ මයුරවංශ පද්මසිරි ජයතිලක සහ කොහිලවත්ත ගමගේ කුසුමලතා.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2009.08.21 වන දින අංක 1616 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2009.08.27 වන දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක : 220/5, ගම්පහ පාර, යක්කල යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඩබ්ලිව්. එම්. වික්‍රමරත්න විසින් 2009.11.17 වැනි දින පෙ.ව. 11.45 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ පන්දහස් දෙසිය හැටපහයි ශත අසූදෙකක (රු.305,265.82) මුදලක් වර්ෂ 2009.01.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ තිස්පන්දහස් අටසිය අනූහතයි ශත එකක් (රු.135,897.01) මුදල ද, 2009.03.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් එක්ලක්ෂ හැටනමදහස් තුන්සිය හැටඅටයි ශත අසූ එකක් (රු.169,368.81)ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තුන්ලක්ෂ පන්දහස් දෙසිය හැටපහයි ශත අසූදෙකක් (රු.305,265.82) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ තිස්පන්දහස් අටසිය අනූහතයි ශත එකක් (රු.135,897.01) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.50 % බැගින් වන පොළියක් 2009.04.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට,

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අළුත්කුරු කෝරළේ, දාසියපත්තුවේ කටාන ප්‍රාදේශීය සභා සීමාවේ ආඩිඅම්බලම උපකාර්යාලයේ ආඩිඅම්බලම වල්පොල ග්‍රාමයේ හි පිහිටි දවටගහකුඹුර නමැති ඉඩමට 1998.01.22 දින බී. එස්. නානායක්කාර මානක තැන විසින් මැන සම්පාදිත අංක 1036 පිඹුර ප්‍රකාර ලොට් 6 ට මායිම්, උතුරට : ලොට් 09 (අඩි 15 ක මාර්ග රක්ෂිතය)ද, නැගෙනහිරට : ලොට් 7ද, දකුණට : එම ඉඩමේම ඉතිරි කොටස ද, බටහිරට : ලොට් 5 ද, මායිම් තුල පිහිටි පර්චස් දාහතරක් (අක්. 0, රූඩ්. 0, පර්. 14) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේ සමග මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C803/210 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2009 ක් වූ ඔක්තෝබර් මස 14 වෙනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

10-1091

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0200003738.

ණයකරුගේ සම්පූර්ණ නම : පලවෙනි ආරච්චිගේ ලලිත් සිරිචන්ද්‍ර පෙරේරා.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2009.06.19 වන දින අංක 1607 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2009.06.25 වන දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනකුරල්" පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක : 220/5, ගම්පහ පාර, යක්කල යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඩබ්ලිව්. එම්. වික්‍රමරත්න විසින් 2009.11.19 වන දින පෙ.ව. 10.30 ට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ අනූදහස් හාරසිය පනස්එකයි ශත හැත්තෑහතක (රු.490,451.77) මුදලක් වර්ෂ 2009.01.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් ලක්ෂ හතරක (රු.400,000.00) මුදල ද, 2009.01.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් අනූදහස් හාරසිය පනස් එකයි ශත හැත්තෑහතක් (රු.90,451.77)ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හාරලක්ෂ අනූදහස් හාරසිය පනස්එකයි ශත හැත්තෑහතක් (රු.490,451.77) ද,

(2) එකී රුපියල් ලක්ෂ හතරක (රු.400,000.00) මුදල මත අයවිය යුතු වර්ෂයකට 20.00% බැගින් වන පොළියක් 2009.02.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට,

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ මැදපත්තුවේ ගම්පහ නගර සභා සීමාවේ අලුත්ගම ග්‍රාමයේ ශ්‍රී බෝධි පාරේ වරිපනම් අංක 371/8 හි පිහිටි වලව්වත්ත නමැති ඉඩමට 1991.03.14 දින අයි. එම්. සී. ප්‍රනාන්දු තැන විසින් මැන සම්පාදිත අංක 943 පිඹුර ප්‍රකාර ලොට් 09 ට මායිම්, උතුරට : ලොට් 18 ද, නැගෙනහිරට : ලොට් 08 ද, දකුණට : ලොට්10 ද, බටහිරට : පිඹුරු අංක 943 හි ලොට් 19 සහ 13 ද යන මායිම් තුළ පිහිටි පර්චස් එකොළහයි දශම හයක් (අක්.0, රූ. 0, පර්. 11.6) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් ගොඩනැගිලි හා සියලුදේ ද මාර්ග පරවශතාවය ද සමග ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 844/86 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2009 ක් වූ ඔක්තෝබර් මස 14 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

10-1093

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0104400529.

ණයකරුගේ සම්පූර්ණ නම : හෙට්ටිආරච්චිගේ රංජිත් රත්නසිරි.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2009.06.26 වැනි දින අංක 1608 දරන ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ වර්ෂ 2009.06.29 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර, පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 220/5, ගම්පහ පාර, යක්කල යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඩබ්ලිව්. එම්. වික්‍රමරත්න විසින් 2009.11.18 වැනි දින පෙ.ව. 10.30 ට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් අනූඑක්දහස් තිස්දෙකයි ශත පනස්නමයක (රු.91,032.59) මුදලක් වර්ෂ 2007.09.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැත්තෑහය දහස් අටසිය අනූතුනයි ශත අසූහතක (රු.76,893.87) මුදල ද, 2007.09.30 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් දාහතරදහස් එකසිය තිස්අටයි ශත හැත්තෑ දෙකක් (රු.14,138.72) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් අනූඑක් දහස් තිස්දෙකයි ශත පනස් නමයක් (රු.91,032.59) ද,

(2) එකී රුපියල් හැත්තෑහය දහස් අටසිය අනූතුනයි ශත අසූහතක (රු.76,893.87) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.50% බැගින් වන පොළියක් 2007.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට,

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාවේ, අංක 01 මහර උපකාර්යාලයේ, පින්නමැද, අංක 01, දලුපිටිය පාරේ, වරිපනම් අංක 128/13/B හි පිහිටි තලගහකුඹුර නොහොත් ඉඹුල්ගහකුඹුර, හොරියන්වෙල, ඉඹුල්ගහකුඹුර නොහොත් කිතුලේකුඹුර, දෙනියෙකුඹුර, කහටගහකුඹුර සහ වැටකෙයියාකුඹුර නමැති ඉඩමට 1994.04.25 දින ඒ. ඒ. පී. ජේ. පෙරේරා මානක තැන විසින් මැන සම්පාදිත අංක 403A පිඹුර ප්‍රකාර ලොට් 5 ට මායිම්, උතුරට : පිඹුරු අංක 515/1991 හි ලොට් 4A හි ඉතිරි කොටස ද, නැගෙනහිරට : ලොට් 14 ද, දකුණට : ලොට් 6 සහ ලොට් 16 ද, බටහිරට: ලොට් 16 සහ ලොට් 4 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් දහතුනයි දශම පහක (අක්. 0, රූඩ්. 0, පර්. 13.5) වපසරිය යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළුදේ ද මාර්ග පරවශතාවය ද සමග ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C437/62 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2009 ක් වූ ඔක්තෝබර් මස 14 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

10-1092

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුව

ණය අංකය : 0130001358 සහ 0130001135.

ණයකරුගේ සම්පූර්ණ නම : ගල්හේනගේ කිංස්ලි ජයලත් පෙරේරා සහ ඉලේපෙරුමගේ ජයකාන්ති සහ ජීවිත භුක්තිකරු වීරක්කොඩිගේ පාවිස්ටිනා අල්විස්.

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997

අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2009.06.26 වැනි දින අංක 1608 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2009.06.26 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත් වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 220/5, ගම්පහ පාර, යක්කල යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඩබ්ලිව්. එම්. වික්‍රමරත්න විසින් 2009.11.20 වැනි දින පෙ.ව. 11.00 සිට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් තිස්හතරලක්ෂ විසිඑක්දහස් තුන්සිය හතළිස්අටයි ශත හැත්තෑතුනක (රු.34,21,348.73) මුදලක් වර්ෂ 2009.01.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් විසිනමලක්ෂ අසූදෙදහස් හයසිය අසූහතරයි ශතහයක (රු.29,82,684.06) මුදල ද, 2009.01.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් හාරලක්ෂ තිස්අටදහස් හයසිය හැටහතරයි ශත හැටහතක් (රු.4,38,664.67) ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තිස්හතරලක්ෂ විසිඑක්දහස් තුන්සිය හතළිස්අටයි ශත හැත්තෑතුනක් (රු.34,21,348.73) ද,

(2) එකී රුපියල් විසිනමලක්ෂ අසූදෙදහස් හයසිය අසූහතරයි ශත හයක (රු.29,82,684.06) මුදල මත අයවිය යුතු වර්ෂයකට 22% 19.90% බැගින් වන පොළියක් 2009.02.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාවේ මහරගම හි පිහිටි කහටගහලන්ද නමැති ඉඩමට 2001.01.18 දින ඒ. සේනානායක බලයලත් මානක තැන විසින් මැන සම්පාදිත අංක 1377 පිඹුර ප්‍රකාර ලොට් 01 ට මායිම්, උතුරට : පාර සහ හයිලෙවල් පාර 2 ද, නැගෙනහිරට : හයිලෙවල් පාර සහ අඩි පාර ද, දකුණට : අඩි පාර සහ ලොට් 2 ද, බටහිරට : ලොට් 2 සහ පාර ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහක් (අක්. 0, රූඩ්. 0, පර්. 5) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේද සමග ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M2522/272 හි ලියාපදිංචි කර ඇත.

වර්ෂ 2009 ක් වූ ඔක්තෝබර් මස 14 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

10-1087

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංකය : 2/52788 එෆ්2/220.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1998.07.03 ගැසට් පත්‍රයේ සහ 2001.06.04 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූද යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අය විය යුතු පොළිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපල හා භූමිය මීගමුව, ප්‍රනාන්දු ඇවනිව්, අංක 22 හි බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා විසින් එම දේපළ පිහිටි ස්ථානයේදී 2009.11.25 වැනි දින පස්වරු 2.00 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

ගම්පහ දිස්ත්‍රික්කයේ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ දලුවකොටුව පිහිටි ඇනෙස්ටන් නැමති ඉඩමේ කැබලි අංක 6 ලෙස දැක්වෙන බලයලත් මිනින්දෝරු ඩබ්. ජේ. එම්. පී. ඩයස් විසින් සැකසුණු 1990.06.27 දින හා අංක 1449ඒ/1990 දරන පිඹුරේ කැබලි අංක 6 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 21.50 ක් වූ බෙදා වෙන් කරන ලද බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ.

මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක ඊ 711/164 හි ලියාපදිංචි කොට ඇත.

තවද එකී අංක 1449/ඒ දරන පිඹුරේ කැබලි අංක 7 (අඩි 8 ක් පළල මාර්ගයක් සඳහා වෙන් කරන ලද) බිම් කොටස මතින් ඇති මාර්ග අයිතියද සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 ඔක්තෝබර් මස 15 වැනි දින.
අංක 269, ගාලු පාර, කොළඹ 03.

10-1004/1

---

### නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී.
(කලින් නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ කුරුණෑගල, වෙළගෙනෙන් පර්චස් 13ක අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඩවිල්ල හත්පත්තුවේ කුඩාගල්බොඩ කෝරළේ, කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාව තුළ වෙළගෙනේ හි පිහිටි "ගුරුගොඩේහේන නොහොත් ගුරුගොඩේවත්ත"

යන නමින් හඳුන්වනු ලබන 1995.04.10 දින අංක 45/95 දරන පිඹුරේ බෙදා වෙන් කල ලොට් 07 දරන ඉඩම සමග ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සියලු දේද වන අතර ඒ සමගම පිඹුරු අංක 45/95 හි දැක්වෙන පොදු මාර්ග පරවශ්‍යතාවයද වේ.

නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී නමින් සහතික කරන ලද වර්ෂ 2007.08.07 වැනි දිනැති අංක 700 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීමට කුරුණෑගල පදිංචි චරිත උදාර ප්‍රියංග සියඹලාපිටිය විසින් පැහැර හැර ඇති බැවින් නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී විසින් මා වෙත පවරන ලද බලය මත ඉහත කී දේපළ වර්ෂ 2009 ක් වූ නොවැම්බර් මස 19 දින පෙරවරු 11.00 ටදේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩිදුර විස්තර සඳහා 2009.10.02 දින ශ්‍රී ලංකාණ්ඩුවේ *ගැසට් පත්‍රයද*, 2009.10.22 සහ 23 දිනයන්හි "ද අයිලන්ඩ්", දිවයින සහ "තිනකරන්" යන පුවත්පත් ද බලන්න.

*දේපළට ප්‍රවිශ්ඨ වන මාර්ගය.*- කුරුණෑගල ඔරලෝසු කනු මංසන්දියේ සිට පුත්තලම ප්‍රධාන මාර්ගයේ කි. මී. 8.25 පමණ ගමන්කර "වෙළඟන පාර" සඳහන් පුවරුව ට පෙර දකුණට හැරී (කොන්ක්‍රීට් අතුරා ඇති) ග්‍රීන් විලේජ් පාර මීටර් 150 ක් පමණ ගමන් කොට කුඹුරුයායට පෙර පාරට මුහුණලා මෙම පාරේ වමට මෙම දේපල පිහිටා ඇත.

වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් එවෙලේම වෙන්දේසිකරු වෙත ගෙවිය යුතුයි. (1) ගැණුම් මුදලින් 10% ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක් ද, (3) වෙන්දේසිකරුගේ ගාස්තු වශයෙන් 2 1/2% ක් ද, (4) සියලුම ප්‍රචාරක හා වෙන්දේසි වියදම් ද, (5) ලිපිකරු සහ සෝෂක ගාස්තු වශයෙන් රු.1,500,ක්ද, (6) විකිණීමේ කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 2,000 ක්ද වේ. ගැණුම් මිළේ ඉතිරි 90% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගෙවා අවසන් කළ යුතුයි.

හිමිකම් ඔප්පු සහ අනෙකුත් සියලුම ලියකියවිලි හා විස්තර ලබා ගැනීම සඳහා කොළඹ 02, නවම් මාවතේ අංක 40 දරන ස්ථානයේ නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී හි කළමනාකරු නීති - අයකිරීම් ගෙන් විමසන්න. දුරකථන අංක : 2448448, 2437701 ෆැක්ස් අංකය 2440196 විමසන්න.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස් තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 2873656, 0777-672082,
ෆැක්ස් අංකය : 2871184.

10-998

---

## හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. - දෙමටගොඩ ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එල්. ඒ. ඩී. ගුණතිලක විසින් සහතික කරන ලද්දා වූ හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ ද 2005.12.16 දින සහ අංක. 1471 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් බී. ඩී. ටී. ධර්මතිලක විසින් සහතික කරන ලද්දාවූ ද අංක 2141 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම, ලැනික් ස්පෝට්ස් හි තනි අයිතිකරු වන විජේසිංහ පතිනිගේ දිනේශ් පෙරේරා විජේසිංහ ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම හා වෙන්දේසිකරු ගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල එම දේපල පිහිටි ස්ථානයේදී, 2009 ක් වූ නොවැම්බර් මස 20 වැනි දින පෙ.ව. 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපල*:- බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ (නමුත් කොළඹ දිස්ත්‍රික්කයේ ලියාපදිංචි කර ඇති) සියනෑ කෝරළේ, අධිකාරිපත්තුවේ කැළණිය ප්‍රාදේශීය සභා සීමාවේ කැළණිය ඒකකය තුළ වනවාසල ගමේ පිහිටි අංක 107 සහ 109 දරන කෝන්ගහවත්ත සහ මුල්ලෙකුඹුරපිල්ලෑව නමැති ලොට් 01 ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2009.10.02 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* හා 2009.10.05 වැනි දින දිවයින, ද අයිලන්ඩ්, සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.*-කොළඹ සිට මහනුවර මාර්ගයේ තොරණ හන්දියෙන් වමට හැරී යන විට හමු වන වත්තල, වනවාසල දුම්රිය ස්ථානයට අතු පාරවල් බෙදෙන හන්දියෙන් එම දුම්රිය පාරේ මීටර් 300 ක් පමණ ගිය විට ප්‍රසිද්ධ පාරේ වම් අත පැත්තේ ග්‍රාමීය බැංකුවට යාබදව මෙම දේපල හමු වේ.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය :-

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු.2000) ක් ද,
5. ලිපිකරු හා සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු.500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මිළෙන් ඉතිරි සියයට අනූවක් වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාල ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අය කිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10 (දුරකථන අංක : 2661826, 2661835) ගෙන් ලබාගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු,
හා බලයලත් වෙන්දේසිකරු.

අංක 56, 'ශින් ක්යෝකුෂින් '
කටුවාවල පාර, බොරලැස්ගමුව.
දුරකථන අංක : 0112-509442
0777-378441
071 - 4424478
ෆැක්ස් අංකය : 0114 -617059

10-987

**හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. - කටුනායක ශාඛාව**

(කලින් සීමා සහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කිව්. ටී. තිසේරා විසින් සහතික කරන ලද්දා වූ හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. නමට ලියන ලද්දා වූ 2006.03.06 දින සහ අංක 5265 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම ජයසූරිය ආරච්චිගේ රෝහණ ජයසූරිය ණයකරු හැටියට පැහැර හැර ඇති හෙයින්,

හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී. විසින් මා වෙත පරවා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියළුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපල එම දේපල පිහිටි ස්ථානයේ දී,

2009ක් වූ නොවැම්බර් මස 17 වැනි දින ප. ව. 3.00ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපල.*- බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ අතුරුගිරියෙහි පිහිටි කුරුප්පු අච්චිය මුකලාන නමැති ඉඩමට බලයලත් මානක ඒ. ඊ. විජේසූරිය විසින් 1983 අප්‍රේල් මස 24 වැනි දින මැන සාදන ලද අංක 1945 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් සී ලෙස දැක්වෙන ඉඩම් කොටස සහ එහි පිහිටි සියලුම දේත් වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2009.10.02 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* හා 2009.10.05 වැනි දින දිවයින, ද අයිලන්ඩ් සහ තිනකරන් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම.*- කොළඹ කඩුවෙල පාර ඔස්සේ බත්තරමුල්ල පසුකොට මාලබේ නගරයෙන් අතුරුගිරිය පාරට හැරී කි. මී. 5ක් පමණ ගමන් කර දකුණු පසට ඇති ගෝවින්න මාවතට හැරී කිලෝ මීටරයක් පමණ දුර ගෙවා එතැන ඇති ප්‍රාදේශීය සභාවට අයත් ගුරු පාරේ දකුණට හැරී මීටර් 200ක් ගිය විට වම් අත පැත්තේ මෙම දේපල පාරක් සඳහා වෙන් කල කොටස ද සමග පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් සියයට දහය (10%)ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහ (2.5%) ක් ද,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2000)ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සීය (රු. 500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනුවක් වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතුය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක මුදල අහිමි කිරීමට සහ දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරික්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී., අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10. (දුරකථන අංකය 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුලු දිවයිනටම සාම විනිසුරු)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 56, ශින් ක්යෝකුෂින්,
කටුවාවල පාර,
බොරලැස්ගමුව.

දුරකථන අංක : 0112 509442,
0777 378441,
071 4424478,
ෆැක්ස් අංකය : 0114 617059.

10-988

---

**හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී - කළුතර**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව යනුවෙන් හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම පිළිබඳ දැන්වීම

පානදුර ප්‍රසිද්ධ නොතාරිස් පී.වී.එන්.ඩබ්. පෙරේරා විසින් 2008.07.10 වැනි දින හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී නමට ලියා සහතික කරන ලද අංක 2454 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම රාජපක්ෂ පතිරාජගේ දොන් රංග මනෝජ් කුමාර ජයසේකර සහ දිවිදලගේ ශානිකා අසන්ති සිල්වා යන අයවළුන් බන්ධනදායීන් ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින් එකී ණය මුදල් සහ ඒ මත අයවිය යුතු නෛතික පොලිය සහ වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළු සියළු මුදල් අයකර ගැනීම සඳහා ඉහත කී හැටන් නැෂනල් බෑන්ක් පී.එල්.සී ආයතනය මා වෙත පවරා ඇති බලතල අනුව මෙහි පහත උපලේඛනයෙහි විස්තර කර ඇත්තා වූ දේපල වර්ෂ 2009.11.23 වැනි දින ප.ව. 2.00ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මේ පිළිබඳ යෝජනා සම්මුතිය 2009.09.03 දින *ගැසට් පත්‍රයේ* සහ 2009.09.08 වැනි දින අයිලන්ඩ් දිවයින සහ තිනකරන් පත්‍රවල පළ වී ඇත.

***උපලේඛනය***

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කළුතර තොටමුණ දකුණේ මග්ගෝන බැද්දේ බේරුවල ප්‍රාදේශීය සභා සීමාවේ පයියාගල මග්ගෝන මග්ගෝන නැගෙනහිර ටුක්කුටුවාවත්ත නොහොත් වඩුගේවත්ත නමැති ඉඩමට බලයලත් මානක බී. කේ. ජී. ඩබ්. ගුණවර්ධන විසින් 2007.05.26 වන දින මැන සාදන ලද අංක 1692 දරන පිඹුරෙහි ලොට් අංක 1බී දරන කොටස (ප්‍රමාණය පර්චස් හතයි දශම බින්දුවයි හතක් - අ. 0, රූ. 0, පර්. 7.07) එම පිඹුරෙහි ලොට් අංක 1සී දරන කොටස (ප්‍රමාණය පර්චස් බින්දුවයි දශම තුනයි බින්දුවක් - අ. 0, රූ, 0, පර්. 0.30) සහ මෙම ඉඩමට බලයලත් මානක බී. කේ. පී. ඩබ්. ගුණවර්ධන විසින් 1997.12.01 දිනැති සහ අංක

579ඒ දරන පිඹුරෙහි ලොට් අංක 2 දරන කොටස (ප්‍රමාණය පර්චස් එකොළහයි දශම පහයි හයක්- අ. 0, රූ. 0, පර්. 11.56)

*දේපලට පිවිසීම*.- මග්ගොන නගරයේ සිට බේරුවල දෙසට මීටර් 100 පමණ ගාළු පාරේ ගමන් කිරීමේදී වම් අත පැත්තේ හමුවන ශාන්ත පීතර පාරේ (මෝනිස් බේකරිය ඉදිරිපිට) මීටර් 450 පමණ ගමන් කිරීමේදී වම් පැත්තේ මෙම දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසන් වනවාත් සමගම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් මුදලින් කල යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) ක්,
2. ප්‍රාදේශීය සභා බදු සියයට එකක් (1%) ක්,
3. සියළුම ප්‍රචාරක වියදම්,
4. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් (ගැණුම් මිලෙන් 2.5%),
5. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු,
6. ලිපිකරු සහ සෝෂක ගාස්තු.

ගැණුම් මිළෙන් ඉතිරි සියයට අනූවක් (90%) විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී ආයතනයට ගෙවිය යුතු අතර එසේ ගෙවීමට අපොහොසත් වුවහොත් ඒ වන විට ගෙවා ඇති මුදල් අහිමි කිරීමට සහ එම දේපල නැවත වෙන්දේසියේ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු තිරප්පු පරීක්ෂාව සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරු (ණය අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී එල් සී අංක 479 හි ටී. බී. ජයා මාවත, කොළඹ 10, දුරකථන අංක 2661826 යෙන් ලබාගත හැක.

හේමචන්ද්‍ර දළුවත්ත,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු,
සහ තක්සේරුකරු.

අංක 99 උසාවිය පාර,
කොළඹ 12
දුරකථන අංකය : 071- 4175944.

10-1068

---

## නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී.
(කලින් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ, දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා සීමාවේ කළුබෝවිල පිහිටි ඇන්ඩර්සන් පාරේ වරිපනම් අංක 65/12 දරන බක්මීගහකුඹුර මුනමල්ගහකුඹුර සහ මීගහකුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. සී. එල්. සී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 33/2005 සහ 2005 සැප්තැම්බර් මස 10 වැනි දින දරන පිඹුර ප්‍රකාර ලොට් B නමැති බෙදා වෙන් කළ බිම් කොටස, ප්‍රමාණය අ. 0, රූ. 0, පර්. 9.37 ( සහ ඊට අයිති ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සෑම සියළු දේත් සමගය) ඉහත කී ඉඩමට පහත සඳහන් වන අංක 350 දරන උකස් බැඳුම්කරයේ සවිස්තරව දක්වා ඇති මාර්ග අයිතිය ද සමගය. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජෙනිච්චි පියුමිනී රණසිංහ විසින් ලියා සහතික කරන ලද්දාවූ ද නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. (කලින් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්) නමට ලියන ලද්දා වූ ද අංක 350 සහ වර්ෂ 2005 ක් වූ ඔක්තෝබර් මස 20 දිනැති උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම දෙහිවල, කළුබෝවිල, කඩවත පාරේ අංක 87/5A, දරන ස්ථානයේ පදිංචි ප්‍රසන්න සම්පත් හෙට්ටිආරච්චි යන අය විසින් පැහැර හැර ඇති හෙයින්, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී විසින් අප වෙත පවරා ඇති බලය ප්‍රකාරව 2009 ක් වූ නොවැම්බර් මස 20 වැනි දින පෙ.ව. 10.00 ට ඉහත සඳහන් දේපල අප විසින් එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2009.09.18 වන දින *රජයේ ගැසට් පත්‍රයද*, 2009.09.22 වැනි දින දිවයින, ද අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත් ද බලන්න.

දේපලට පිවිසීම.- කොළඹ ගාල්ල "ඒ2" අධිවේගී මාර්ගයේ කිලෝ මීටර් 8 පමණ ගමන් කර දෙහිවල පාලම පසු කර වමට හැරී රෝහල් වීදිය එනම් ශ්‍රී කොටගම වාචිස්සර මාවතේ කිලෝමීටර් 1 3/4 ගමන් කර දකුණට හැරී ඇනඩර්සන් පාරේ තවත් කිලෝමීටර් 1/2 ගමන් කර වමට ඇති අඩි 15 පළල ගල් බොරළු සහිත පාරේ මීටර් 100 පමණ ගමන් කල විට අදාළ දේපළ දකුණු පසින් පිහිටා ඇත.

*ගෙවීම් කලයුතු ආකාරය*.- විකිණීම ස්ථිර කල වහාම සාර්ථක ගැණුම්කරු විසින් මිටිය පහත හෙලූ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසි කරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුයි.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. ගැණුම් මිළෙන් ඉතිරි සියයට අනූව 90% විකිණීමේ දින සිට දින 30 ක් තුළදී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතුය,
3. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
4. වෙන්දේසිකරුගේ වෘත්තීය ගාස්තු තීන්දු වූ මිළෙන් සියයට දෙකයි දශම පහක් (2.5%),
5. බැංකුව විසින් දරන ලද සියලුම ප්‍රචාරන සහ අනෙකුත් වියදම්,
6. ලිපිකරු සහ සෝෂක වේතන රු 500,
7. නොතාරිස් ගාස්තු විකුණුම් කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

කළමණාකාරු - පාරිභෝගික නීති කටයුතු, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. අංක 256, ශ්‍රීමත් රාමනාදන් මාවත, කොළඹ 15.

දුරකථන අංක :011-4682403, 077-3918733

ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවෝ,
බලයලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ,
සහ උසාවි කොමසාරිස්වරු කොළඹ
වාණිජ මහාධිකරණය සහ දිසා අධිකරණය,
බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 182, තෙවන මහල,
හල්ස්ඩෝෆ් පාර,
කොළඹ 12,
දුරකථන/ෆැක්ස් අංකය : 011-2388318.

10-1086

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී.**
(කලින් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුණේ පානදුර තල්පිටි දෙබැද්දේ පානදුර ප්‍රාදේශීය සභා සීමාව තුළ (කෙසෙල්වත්ත උපකාර්යාලය) ගොරකාන පිහිටි කොළඹ පාරේ වරිපනම් අංක 176/1 දරන කුරුහෙරලියගහවත්ත හෙවත් පුහුහෙරලියගහවත්ත සහ කෝන්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු බී. එල්. ඩී. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 6591 (A ) සහ 2006.12.08 දිනැති පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ බිම් කොටස ප්‍රමාණය අ. 0, රූ. 0. පර්. 13.25 (ඊට අයිති ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සෑම සියළු දේත් මාර්ග අයිතිවාසිකම ද සමගය) කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. කලන්සූරිය විසින් ලියා සහතික කරන ලද්දා වූ ද නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. (කලින් නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ්) නමට ලියන ලද්දා වූ ද අංක 759 සහ වර්ෂ 2007 ක් වූ අගෝස්තු මස 09 වැනි දිනැති උකස් බැඳුම්කරය සහ අංක 794 සහ වර්ෂ 2007 ක් වූ ඔක්තෝබර් මස 11 වැනි දිනැති වැඩි කළ උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම මොරටුව, ගොරකාන, ගාලු පාරේ අංක 170 දරන ස්ථානයේ පදිංචි බැමින හෙන්නදිගේ මාලා ඉන්දුමතී ප්‍රනාන්දු යන අය විසින් පැහැර හැර ඇති හෙයින්, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. විසින් අප වෙත පවරා ඇති බලය ප්‍රකාරව 2009 ක් වූ නොවැම්බර් මස 24 වැනි දින පෙ.ව. 10.00ට ඉහත සඳහන් දේපල අප විසින් එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. යෝජනා සම්මුතිය සඳහා 2009.09.05 වැනි දින *රජයේ ගැසට් පත්‍රයද*, 2009.09.25 වැනි දින දිවයින, ද අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත්ද බලන්න.

*දේපලට පිවිසීම.-* කොළඹ ගාල්ල "ඒ2" අධිවේගි මාර්ගයේ කිලෝ මීටර් 22 පමණ ගමන් කල විට අදාළ දේපල වම් පසින් පිහිටා ඇත. කිලෝ මීටර් 22 කණුව ඉදිරියෙන්.

*ගෙවීම් කල යුතු ආකාරය.-* විකිණීම ස්ථිර කල වහාම ගැණුම්කරු විසින් මිටිය පහත හෙලූ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුයි.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව 90% විකිණීමේ දින සිට දින 30ක් තුළදී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතුය,
3. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
4. වෙන්දේසිකරුගේ වෘත්තීය ගාස්තු තීන්දු වූ මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%),
5. බැංකුව විසින් දරන ලද සියලුම ප්‍රචාරක සහ අනෙකුත් වියදම්,
6. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
7. නොතාරිස් ගාස්තු විකුණුම් කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

කළමණාකරු - පාරිභෝගික නීති කටයුතු, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී. අංක 256, ශ්‍රීමත් රාමනාදන් මාවත, කොළඹ 15.

දුරකථන අංක : 011-4682403, 077-3918733.

ත්‍රිවංක සහ සේනානායක වෙන්දේසිකරුවෝ,
බලයලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ,
සහ උසාවි කොමසාරිස්වරු කොළඹ
වාණිජ මහාධිකරණය සහ දිසා අධිකරණය,
බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 182, තෙවන මහළ,
හල්ස්ඩ්‍රෝෆ් පාර,
කොළඹ 12,
දුරකථන/ෆැක්ස් අංකය : 011-2388318.

10-1085

---

**සෙලාන් බැංකුව පී.එල්.සී. - දෙහිවල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

මෙම දේපල දෙහිවල පදිංචි හෙට්ටිආරච්චිගේ අනිල් රෝහණ පෙරේරා යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබා ගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර තොටමුන, පානදුර තල්පිටි දෙබැද්ද, පානදුර ප්‍රාදේශීය සභාවේ, තංතිරිමුල්ල උප කාර්යාලය ප්‍රාදේශීය තුළ තුරුප්පුමුල්ල (වල්පොල පට්ටිය) පිහිටි බලයලත් මිනින්දෝරු වයි. කේ. කොස්තා විසින සාදන ලද 1994.04.03 දිනැති අංක 917 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දෙල්ගහවත්ත හෙවත් තල්ගහවත්ත නමැති ඉඩමේ කැබලි අංක 6 බී ලකුණු කල බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස එකී අංක 917 දරන සැලැස්ම අනුව පර්චස් නමයයි දශම එකක් (අ. 0, රූ. 0, පර්. 9.1) විශාල ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියළුම දේ සමග ඉඩම. මෙය පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් එෆ් 316/25 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත සඳහන් දේපල 2009 නොවැම්බර් මස 25 වැනි දින පෙරවරු 10.00 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.-* පානදුර රෝහල් හන්දියේ සිට හොරණ මාර්ගයේ මීටර් 300 ක් පමණ ඉදිරියට ගොස් දකුණු පසට ඇති කිරිබේරිය පාරට හැරී එම මාර්ගයේ තවත් මීටර් 400 ක් පමණ ගියවිට වල්පල පාර හමුවේ. එම පාරේ මීටර් 150 ක් පමණ ගිය විට මාර්ගයේ දකුණුපස අදාළ දේපල පිහිටා ඇත.

*යෝජනා සම්මුති දැන්වීම.-රජයේ ගැසට් පත්‍රයේ* 2009.08.28 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත් වල 2009.08.22 වැනි දින ද තිනකුරල් පුවත්පතේ 2009.09.02 වැනි දින පළ වී ඇත. විකිණීමේ නිවේදනය *රජයේ ගැසට් පත්‍රයේ* 2009.08.28 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, 5. ලිපිකරු සහ සෝෂක වේතනය රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරී (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03, දු.ක. 011-2456285, 2456263, 2456284.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ්. එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත,
කොලොන්නාව,
දුරකථන අංක : 011-3068185, 011-2572940

10-1079

---

**සෙලාන් බැංකුව පීඑල්සී - නිදහස් වෙළඳ කලාපය ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුළ අළුත්කරු කෝරළේ, රාගම් පත්තුවේ, ජාඇල ප්‍රාදේශීය සභා සීමාව තුළ දඬුගම ඒකකයේ කොටුගොඩ ඒකල කුරුඳුවත්ත පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ටී. රත්නායක විසින් සාදන ලද 2003.11.25 සහ 2004.01.23 දිනැති අංක 2094 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඕටීඑස් ඉඩම නමැති මිලේනියම් සිටි මාවත, දෙවෙනි පටුමග වරිපනම් අංක 35 දරන ඉඩමේ ලොට් 245 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම දෙකයි පහක් (අ. 0, රූ. 0, පර්. 7.25) විශාල ගොඩනැගිලි, ගස්, වගා සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍ඉරුව බී 206/205 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත විස්තර කරන ලද ඉඩම පහත විස්තර කරනු ලබන ඉඩමේ නැවත මනින ලද අතුරු බෙදීමක් වේ. පෙර කී කොටුගොඩ ඒකල කුරුඳුවත්ත පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ටී. රත්නායක විසින් සාදන ලද 2003.11.29 දිනැති අංක 2093 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ඕටීඑස් ඉඩම නමැති ඉඩමේ ලොට් 1 ලකුණු කළ බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් අක්කර විසිහයයි රූඩ් තුනයි පර්චස් විසිතුනයි දශම හතරයි අටක් (අ. 26, රූ. 3, පර්. 23.48) විශාල ගොඩනැගිලි, ගස් වගා සහ එහි පිහිටි වෙනත් සියළු දේ සමග ඉඩම. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කාණ්ඩය/පත්‍ඉරුව ඞී 189/44 හි ලියාපදිංචි කර ඇත.

එකී අංක 2094 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් ආර් 27, ආර්. 4, ආර් 5, ආර් 6, සහ ආර් 30 බලයලත් මිනින්දෝරු එම්. ටී. රත්නායක විසින් සාදන ලද 2001.11.05 සහ 2001.11.07 වැනි දිනැති අංක 1877 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන ලොට් 2 සහ 4 උඩින් මාර්ග අයිතිය සහ එකී අංක 2094 දරන සැලැස්මේ සඳහන් සියලු කාණු සහ ලකුණු කළ මාර්ගවල අයිතිය සමග. මෙම දේපල දෙදෙනාම ජාඇල පදිංචි වර්ණකුල පටබැඳිගේ ස්වර්ණා නිලන්ති පෙරේරා සහ සේනානායක මුදියන්සේලාගේ සචිත්‍රා සේනානායක යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

ඉහත සඳහන් දේපල 2009 නොවැම්බර් මස 24 වැනි දින පෙරවරු 10.30 ට එම දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.-*ඒකල හංදියේ සිට ජාඇල මිනුවන්ගොඩ පාරේ කි. මී. 1.8 ක් මිනුවන්ගොඩ දෙසට ඉදිරියට ගිය විට වමට ඇති මිලේනියම් සිට මාර්ගයේ තවත් මීටර් 300 ක් පමණ ඉදිරියට ගොස් දකුණු පසට ඇති මාර්ගයට හැරී තවත් මීටර් 700 ක් (සිල්වර් සෑන්ඩ් පාර්ක් නිවාස යෝජනා ක්‍රමය) ඉදිරියට ගිය විට අදාල දේපල පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම රජයේ *ගැසට් පත්‍රයේ* 2009.05.29 වැනි දින පළවී ඇති අතර, ඩේලිමිරර් සහ ලංකාදීප පුවත්පත්වල 2009.05.15 වැනි දින පළ වී ඇත. වීරකේසරි පුවත්පතේ 2009.05.18 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්, 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් රු. 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30 ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතුය.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : සහකාර සාමාන්‍යාධිකාරී (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2456285, 2456263, 2456284.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු සහ
උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්ස්, අංක 50/3,
විහාර මාවත,
කොලොන්නාව.
දුරකථන අංක : 011-3068185, 011-2572940.

10-1078

**ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව**

ණය අංකය : P010000012.
ණයකරුගේ සම්පූර්ණ නම : සීමාසහිත ලාකෝන් ඉන්වෙස්ට්මන්ට්ස් පුද්ගලික සමාගම

(මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) 2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනතින් සංශෝධිත 1997 අංක 7 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටවනු ලැබූ, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව විසින් යෝජනා සම්මත කරනු ලැබ වර්ෂ 2009.07.10 වැනි දින අංක 1610 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ සහ වර්ෂ 2009.09.02 වැනි දින "ලක්බිම", "ද අයිලන්ඩ්" සහ "තිනක්කුරල්" පුවත්පත්වල පළ කරන ලද නියමය ප්‍රකාර පහත දැක්වෙන මුදල් අයකර ගැනීම පිණිස (කෙසේ වුවද යෝජනා සම්මුතියෙන් අනතුරුව යම් මුදලක් ගෙවා ඇත්නම් එකී මුදල අඩුකොට ඉතිරි මුදල් අයකර ගැනීම සඳහා) පහත විස්තර කර තිබෙන දේපළ අංක 220/5, ගම්පහ පාර, යක්කල යන ස්ථානයෙහි පදිංචි බලයලත් වෙන්දේසිකරු ඩබ්ලිව්. එම්. වික්‍රමරත්න මහතා විසින් 2009.11.18 වැනි දින පෙ.ව. 11.45 ට පහත විස්තර කරනු ලබන දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

උකස් බැඳුම්කරය යටතේ රුපියල් හතලිස් දෙලක්ෂ අනූහතරදහස් තුන්සිය පනස්හතයි ශත හැටහතරක (රු.4,294,357.64) මුදලක් වර්ෂ 2009.01.31 වැනි දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී දේපළ උකස මත බැංකුවට අයවිය යුතු එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් තිස් ලක්ෂයක (රු.30,00,000) මුදල ද, 2009.01.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් දොළොස්ලක්ෂ අනූහතරදහස් තුන්සිය පනස්හතයි ශත හැටහතරක් (රු.12,94,357.64)ද, වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හතළිස්දෙලක්ෂ අනූහතරදහස් තුන්සිය පනස්හතයි ශත හැටහතරක් (රු.42,94,357.64) ද,

(2) එකී රුපියල් තිස් ලක්ෂයක (රු.3,000,000) මුදල මත අයවිය යුතු වර්ෂයකට 28 % බැගින් වන පොළියක් 2009.02.01 වැනි දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් සහ ගාස්තු අයකර ගැනීමට,

**උපලේඛනය**

(1) බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජා - ඇළ ප්‍රාදේශීය සභා සීමාවේ, වල්පොල පිහිටි 'ගොන්නගහවත්ත' වශයෙන් හඳුන්වනු ලබන ඉඩමට 2007 පෙබරවාරි මස 04 වැනි දින ඩබ්. ඩී. එන්. ටී. පෙරේරා මානක තැන විසින් මැන සම්පාදිත අංක 5038 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 1A ට උතුරට : 1993 ජූනි මස 18 වැනි දින එම්. ඩී. එඩ්වඩ් මානක තැන විසින් සම්පාදිත අංක 486A දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 1 සහ 2, නැගෙනහිරට : කේ. ඩී. විමලාවතී සහ කේ. ඩී. කරුණාරත්න යන අයගේ ඉඩම් ද, දකුණට : ලොට් අංක 1G (අඩි 12.6 පළල පාරට වෙන් කිරීම) සහ බටහිරට : ඩී. එස්. එස්. සිරිවර්ධනට අයත් ඉඩම් ද යන මායිම් තුළ පිහිටි පර්චස් නවයයි දශම අටයි පහක (අක්. 0, රූඩ්. 0, පර්. 9.85) වපසරියකින් ඉහත පිඹුරු අංක 5038 ට අනුව වූ මෙම ඉඩම හා ඊට අයත් ගහකොළ ඇතුළු සියළු දේ ද, මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B649/134 හි ලියාපදිංචි වී ඇත.

(2) බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජාඇල ප්‍රාදේශීය සභා සීමාවේ, වල්පොල පිහිටි 'ගොන්නගහවත්ත' වශයෙන් හඳුන්වනු ලබන ඉඩමට 2007 පෙබරවාරි මස 04 වැනි දින ඩබ්. ඩී. එන්. ටී. පෙරේරා මානක තැන විසින් මැන සම්පාදිත අංක 5038 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 1B ට උතුරට : ලොට් අංක 1A නැගෙනහිරට : 1G (අඩි 12.6 පළල පාරට වෙන්කිරීම) දකුණට: ලොට් අංක 1C සහ බටහිරට : ඩී. එස්. එස්. සිරිවර්ධනට අයත් ඉඩම්ද යන මායිම් තුළ පිහිටි පර්චස් හතක (අක්. 0, රූඩ්. 0, පර්. 7.0) වපසරියකින් ඉහත පිඹුරු අංක 5038 ට අනුව වූ මෙම ඉඩම හා ඊට අයත් ගහකොළ ඇතුළු සියළු දේද, මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B649/135 හි ලියාපදිංචි වී ඇත.

(3) බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ රාගම් පත්තුවේ, ජාඇල ප්‍රාදේශීය සභා සීමාවේ, වල්පොල පිහිටි "ගොන්නගහවත්ත" වශයෙන් හඳුන්වනු ලබන ඉඩමට 2007 පෙබරවාරි මස 04 වැනි දින ඩබ්. ඩී. එන්. ටී. පෙරේරා මානක තැන විසින් මැන සම්පාදිත අංක 5038 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 1C ට උතුරට : ලොට් 1B නැගෙනහිරට : ලොට් අංක 1G (අඩි 12.6 පළල පාරට වෙන් කිරීම) දකුණට: ලොට් අංක 1D සහ බටහිරට: ඩී. එස්. එස්. සිරිවර්ධනට අයත් ඉඩම ද යන මායිම් තුළ පිහිටි පර්චස් හයක (අක්. 0, රූඩ්. 0, පර්. 6) වපසරියකින් ඉහත පිඹුරු අංක 5038 ට අනුව වූ මෙම ඉඩම හා ඊට අයත් ගහකොළ ඇතුළ සියළු දේද. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B649/136 හි ලියාපදිංචි වී ඇත.

(4) බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ ජාඇල ප්‍රාදේශීය සභා සීමාවේ, වල්පොල පිහිටි "ගොන්නගහවත්ත" වශයෙන් හඳුන්වනු ලබන ඉඩමට 2007 පෙබරවාරි මස 04 වැනි දින ඩබ්. ඩී. එන් ටී. පෙරේරා මානක තැන විසින් මැන සම්පාදිත අංක 5038 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 1D ට උතුරට : 1C නැගෙනහිරට : ලොට් අංක 1G (අඩි 12.6 පළල පාරට වෙන් කිරීම) දකුණට : ලොට් අංක 1E සහ බටහිරට : ඩී. එස්. එස්. සිරිවර්ධනට අයත් ඉඩම ද යන මායිම් තුළ පිහිටි පර්චස් හයක (අක්. 0, රූඩ්. 0, පර්. 6.0) වපසරයකින් ඉහත පිඹුරු අංක 5038 ට අනුව වූ මෙම ඉඩම හා ඊට අයත් ගහකොළ ඇතුළු සියළු දේද, මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B649/137 හි ලියාපදිංචි වී ඇත.

(5) බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජාඇල ප්‍රාදේශී සභා සීමාවේ, වල්පොල පිහිටි "ගොන්නගහවත්ත" වශයෙන් හඳුන්වනු ලබන ඉඩමට 2007 පෙබරවාරි මස 04 වැනි දින ඩබ්. ඩී. එන්. ටී. පෙරේරා මානක තැන විසින් මැන සම්පාදිත අංක 5038 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 1 E ට උතුරට 1 D නැගෙනහිරට : ලොට් අංක 1G (අඩි 126 පළල පාරට වෙන් කිරීම) දකුණට : ලොට් අංක 1 F සහ බටහිරට : ඩී. එස්. එස්. සිරිවර්ධනට අයත් ඉඩම ද යන මායිම් තුළ පිහිටි පර්චස් හයක (අක්. 0, රූඩ්. 0, පර්. 6.0) වපසරියකින් ඉහත පිඹුරු අංක 5038 ට අනුව වූ මෙම ඉඩම හා ඊට අයත් ගහකොළ ඇතුළු සියළු දේද, මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B649/138 හි ලියාපදිංචි වී ඇත.

(6) බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජාඇල ප්‍රාදේශීය සභා සීමාවේ, වල්පොල පිහිටි "ගොන්නගහවත්ත" වශයෙන් හඳුන්වනු ලබන ඉඩමට 2007 පෙබරවාරි මස 04 වැනි දින ඩබ්.ඩී.එන්.ටී. පෙරේරා මානක තැන විසින් මැන සම්පාදිත අංක 5038 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 1F ට උතුරට : 1E නැගෙනහිරට : ලොට් අංක 1G (අඩි 126 පළල පාරට වෙන්කිරීම) දකුණට: උග්ගස්හේන පාර සහ බටහිරට : ඩී. එස්. එස්. සිරිවර්ධනට අයත් ඉඩම ද යන මායිම් තුල පිහිටි පර්චස් හයක (අක්. 0, රූඩ්. 0, පර්. 6.0) වපසරියකින් යුතු ඉහත පිඹුරු අංක 5038 ට අනුව වූ මෙම ඉඩම හා ඊට අයත් ගහකොළ ඇතුළු සියළුම දේද, මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B649/139 හි ලියාපදිංචි වී ඇත.

(7) බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, ජාඇල ප්‍රාදේශීය සභා සීමාවේ, වල්පොල පිහිටි "ගොන්නගහවත්ත" වශයෙන් හඳුන්වනු ලබන ඉඩමට 2007 පෙබරවාරි 04 දින ඩබ්. ඩී. එන්. ටී. පෙරේරා මානක තැන විසින් මැන සම්පාදිත අංක 5038 දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 1G ට (මාර්ග රක්ෂිතය) උතුරට : 1A නැගෙනහිරට : කේ. ඩී. කරුණාරත්න හා නන්දාවතී සහ ප්‍රේමරත්නට අයත් ඉඩම සහ එම්. ඩී. එඩ්වඩ් මානක තැන විසින් මැන සම්පාදිත අංක 823A දරන පිඹුරේ ලොට් 1 ද, දකුණට : උග්ගස්හේන පාර සහ බටහිරට: ලොට් අංක 1F, 1E, 1D, 1C, හා 1B යන මායිම් තුළ පිහිටි පර්චස් හතයි දශම නවයයි හතක (අක්. 0, රූඩ්. 0, පර්. 7.97) වපසරියකින් ඉහත පිඹුරු අංක 5038 ට අනුව වූ මෙම ඉඩම හා ඊට අයත් ගහකොළ ඇතුළු සියළු දේද. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B649/140 හි ලියාපදිංචි වී ඇත.

වර්ෂ 2009 ක් වූ ඔක්තෝබර් මස 14 වැනි දින කොළඹ දී ය.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

10-1088

---

## කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - රත්මලාන ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී.එල්.සී. මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බලයලත් මානක එස්. ලියනගේ විසින් 2000 ඔක්තෝබර් මස 2 වැනි දින සාදන ලද අංක 177 දරන පිඹුර පරිදි, බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේපත්තු හේවාගම් කෝරළේ, බත්තරමුල්ල උප කාර්යාලයේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ, තලංගම දකුණ පිහිටි කුරුඳුවත්ත පාරේ, වරිපනම් අංක 65/23පී දරන, දැනට ශාන්ත තෝමස් වතුයායේ, (කොටසක්), ලෙස හැඳින්වෙන දෙල්ගහවත්ත, අලුබෝගහලන්ද, බටලාදෙනිය කැලේ, බටලාවත්තෙ දෙනිය, බුන්වැල්ලෙගොඩැල්ල කැලේ, හොරගහමණ්ඩිය කැලේ, බටුදෙනිය කැලේ, ගොරකගහවත්ත. ඇතුන්කැදෙනිය, හොරගහවත්ත, නුගගහවත්ත, අලුබෝගහදෙනිය සහ අලුබෝගහදෙනිය ඕවිට කියන ඉඩමේ බෙදා වෙන්කරන ලද ලොට් 20, පර්චස් හයක් (අ. 0, රූ. 0, පර්. 6) විශාල ඉඩම සහ ඒ තුළ ඇති ගොඩනැගිලි, වගාවන් සහ සියළුදේත් සමග රජීව් ජෝෂප් සෙබස්තියන් හෙවත් රජීව් ජෝෂප් සෙබස්තියන් තුරෙයිරාජා ණයකරු හැටියට ද, ඔහු විසින් කොමර්ෂල් බැංක් ඔෆ් සිලෝන් පී.එල්.සී. වෙත උකස්කරන ලද ඉහත සඳහන් කළ දේපල, 2009 ක් වූ නොවැම්බර් මස 23 වැනි දින පෙ.ව. 10.30 ට එම දේපල පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2007.08.24 වැනි දින *රජයේ ගැසට් පත්‍රයද*, සහ 2007.08.27 වැනි දින ද අයිලන්ඩ් සහ දිවයින පුවත්පත් බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2009.10.30 වැනි දින *රජයේ ගැසට් පත්‍රයද* සහ 2009.11.05 වැනි දින ද අයිලන්ඩ්, දිවයින වීරකේසරී පුවත්පත්ද බලන්න.

පහත සඳහන් ඉඩම් ඔස්සේ ගමන් කිරීමේ අයිතියද සමග වේ.

(1) එකී තලංගම දකුණ පිහිටි බලයලත් මානක එස්. ලියනගේ විසින් 2000 ඔක්තෝබර් මස 02 වැනි දින සාදන ලද අංක 177 දරන පිඹුරේ (අඩි 20 පළල පාරක් සඳහා) බෙදා වෙන් කරන ලද ලොට් 42 දරන පර්චස් තිස්නවයයි දශම අටක් (අ. 0, රූ, 0, පර්. 39.8) විශාල ශාන්ත තෝමස් වතුයායේ (කොටසක් වන) ඉඩම.

(2) එකී තලංගම දකුණ පිහිටි බලයලත් මානක එස්. ඩී. ලියනසූරිය විසින් 1981 ජනවාරි මස 31 වැනි දින සාදන ලද අංක 2184 දරන පිඹුරේ (අඩි 20 ක් පළල පාරක් සඳහා) බෙදා වෙන් කරන ලද ලොට් ඒ 9 දරන රූඩ් එකයි පර්චස් හයක් (අ. 0, රූ. 1 පර්. 6) විශාල ශාන්ත තෝමස් වතුයායේ (කොටසක් වන) ඉඩම.

(3) එකී තලංගම දකුණ පිහිටි බලයලත් මානක එස්. ඩී. ලියනසූරිය විසින් 1981 ජනවාරි මස 31 වැනි දින සාදන ලද අංක 2184 දරන පිඹුරේ (අඩි 10 ක් පළල පාරක් සඳහා බෙදා වෙන් කරන ලද ලොට් ඒ 5 බී දරන පර්චස් විසිඑකයි දශම හයක් (අ. 0, රූ. 0, පර්. 21.6) විශාල ශාන්ත තෝමස් වතුයායේ (කොටසක් වන) ඉඩම.

(4) එකී තලංගම දකුණ පිහිටි බලයලත් මානක ඒ. ඊ. විජේසූරිය විසින් 1983 මාර්තු මස 14 වැනි දින සාදන ලද අංක 1903 දරන පිඹුරේ (අඩි 30 ක් පළල පාරක් සඳහා) බෙදා වෙන් කරන ලද ලොට් ඒ 51 දරන රූඩ් එකයි පර්චස් එකයි දශම හයයි හතරක් (අ. 0, රූ. 1, පර්. 1.64) විශාල ශාන්ත තෝමස් වතුයායේ (කොටසක් වන) ඉඩම.

(5) එකී තලංගම දකුණ පිහිටි බලයලත් මානක එස්. ඩී. ලියනසූරිය විසින් 1977 දෙසැම්බර් මස 16 වැනි දින සාදන ලද අංක 6790 ඒ දරන පිඹුරේ (අඩි 30 ක් පළල පාරක් සඳහා) බෙදා වෙන් කරන ලද ලොට් ඒ 5 ඊජේ දරන රූඩ් එකයි පර්චස් දෙකයි දශම පහක් (අ. 0, රූ. 1, පර්. 2.5) විශාල ශාන්ත තෝමස් වතුයායේ (කොටසක් වන) ඉඩම.

(6) එකී තලංගම දකුණ පිහිටි බලයලත් මානක ජේ. එම්. ඩබ්ලිව්. සමරනායක විසින් 2001 ජනවාරි මස 17 වැනි දින සාදන ලද අංක 1289/ඒ දරන පිඹුරේ (පාරක් සඳහා) බෙදා වෙන්කරන ලද ලොට් 19 දරන පර්චස් විසිහයයි දශම හතරයි හතක් (අ. 0, රූ. 0, පර්. 26.47) විශාල ශාන්ත තෝමස් වතුයායේ (කොටසක් වන) ඉඩම.

(7) එකී තලංගම දකුණ පිහිටි බලයලත් මානක එස්. වික්‍රමසිංහ විසින් 1993 සැප්තැම්බර් මස 01 වැනි දින සාදන ලද අංක 6232 දරන පිඹුරේ (පාරක් සඳහා) බෙදා වෙන් කරන ලද ලොට් 1 බී දරන පර්චස් එකයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 1.5) විශාල ශාන්ත තෝමස් වතුයායේ (කොටසක් වන) ඉඩම.

(8) එකී තලංගම දකුණ පිහිටි බලයලත් මානක එස්. වික්‍රමසිංහ විසින් 1993 නොවැම්බර් මස 25 වැනි දින සාදන ලද අංක 6322 දරන පිඹුරේ (පාරක් සඳහා) බෙදා වෙන් කරන ලද ලොට් 1 සී 3 දරන පර්චස් එකයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 1.5) විශාල ඉඩම.

(9) එකී තලංගම දකුණ පිහිටි බලයලත් මානක ඒ. ආර්. ඩයස් අබේගුණවර්ධන විසින් 1994 සැප්තැම්බර් මස 29 වැනි දින සාදන ලද අංක 3987 දරන පිඹුරේ (පාරක් සඳහා) බෙදා වෙන්කරන ලද ලොට් 'බී' දරන පර්චස් බිංදුවයි දශම හතයි තුනක් (අ. 0, රූ. 0, පර්. 0.73) විශාල ශාන්ත තෝමස් වතුයායේ (කොටසක් වන) ඉඩම

*ඉඩමට පිවිසීම.*-බත්තරමුල්ල තලවතුගොඩ මංසන්දියේ සිට පැලවත්ත දෙසට මීටර් 500 ක් පමණ ගියවිට දකුණු පසින් කුමාරගෙවත්ත පාර හමුවේ. එම පාරේ මීටර් 500 ක් පමණ ඉදිරියට ගියවිට වම් අත දෙසින් වීරසිංහ මාවත හමුවේ. එම මාවත ඔස්සේ මීටර් කීපයක් ඉදිරියට ගියවිට

"කෙල්සි හවුස් බෘංකියා රේන්ජ්" සංකීර්ණය හමුවේ. අදාල දේපල මෙම සංකීර්ණයේ තනි ඒකකයක් තුළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* විකිණීම ස්ථිර කල වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
2. පළාත් සභා අයබදු සඳහා සියයට එකක්(1%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් ගැණුම් මිලෙන් සියයට දෙකයි දශම පහක් (2.5%),
4. නොතාරිස් ගාස්තුව රු. 2000,
5. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
6. වෙන්දේසිය සඳහා වැයකරන ලද සියළුම ප්‍රචාරක වියදම්,
7. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුල දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ රත්මලාන ශාඛාවේ තැන්පත් කළ යුතුයි.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

අංක 99,
උසාවිය පාර,
කොළඹ 12,
දුරකථන/ෆැක්ස් : 011-2445393

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී,
අංක : 381, ගාලු පාර,
රත්මලාන,
දුරකථන අංක : 011-2738126
ෆැක්ස් අංකය : 011-2715514.

10-1038

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ )

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ගිණුම් අංකය : 0069 5000 0285
ඒ. ඩී. ප්‍රේමචන්ද්‍ර

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2007 ඔක්තෝබර් මස 26 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව බැඳුම්කර අංක 1235 ප්‍රකාර රුපියල් නමලක්ෂ පනස් හතර දහස් අටසිය අසූදෙකයි ශත හතලිස් හතරක (රු. 954,882.44) මුදලක් 2007 ජුනි 28 දින සිට බැඳුම්කර අංක 1235 මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් අටලක්ෂ අනූනමදහස් අටසියයක (රු. 899,800) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහඅටක් (18%) බැගින් වූ පොලිය ද, හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.07.24 දින රජයේ ගැසට් පත්‍රයේ 2009.09.10 වැනි දින දිවයින, අයිලන්ඩ් සහ තිනකුරල් දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2009.11.14 වැනි දින ප. ව. 2.30 හි දී පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ උඩුගහ පත්තුවේ, ඇස්වත්ත පිහිටි 'දියපොතකැලේ' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන යූ. එල්. එන්. ටී. චන්දන යන අය විසින් සාදන ලද 1997 ඔක්තෝබර් මස 12 දාතම හා අංක 1311 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : ඒ. කේ. අංගෝනෝනා හා වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ කේ වෙත්තසිංහ විසින් හිමිකම් කියනු ලබන ඉඩම නැගෙනහිරට : කේ. වෙත්තසිංහ විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ ඩී. බී. වැලිකල විසින් හිමිකම් කියනු ලබන ඉඩම දකුණට : පාර (පුද්ගලික) සහ බස්නාහිරට : ඒ. කේ. අංගෝනෝනා හා වෙනත් අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ ලොට් 2 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් තුනයි පර්චස් විසිහතක් (අ. 1 රූ. 3 පර්. 27) විශාල ඉඩම් කොටස සමග පස ගහකොළ වගාවන්, සහ එහි පිහිටි සෑම සියළු දේ හා මාර්ග අයිතීන් ද වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශ්‍යතාවන් ද වෙනත් අයිතීන් ද ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරු අංක 1311 ට අනුව වෙලුම/පත්ඉරුව පී 104/163 හි අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී පිඹුරු අංක 1311 හි ලොට් 3 වෙළුම/පත්ඉරුව පී 104/165 හි අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10-1075/1

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ )

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ගිණුම් අංකය : 0052 5000 0377
ආර්. ඒ. ඩී. ලලිත්

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2007ක් වූ අගෝස්තු මස 30 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් විසිලක්ෂ අසූදහස් හයසිය විසිහයයි ශත හැත්තෑඑකක (රු. 2,080,626.71) මුදල ද, 2007 මැයි 05 වැනි දින සිට විකුණුම් දිනය තෙක්, රුපියල් දහනමලක්ෂ එකොළොස් දහස් හාරසිය හතළිස්හතයි ශත අනූතුනක (රු. 1,911,447.93) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළවයි දශම පහක් (15.5%) බැගින් වූ පොලිය ද, හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2009.06.26 දින රජයේ *ගැසට් පත්‍රයේ*, 2009.01.15 වැනි දින දිවයින, අයිලන්ඩ් සහ තිනකුරල් දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2009.11.14 වැනි දින පෙ. ව. 11.30 ට පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාවන් තුළ කොට්ටාව හි පිහිටි 'ගලබොඩවත්ත' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන එස්. ජී. රණසිංහ යන අය විසින් සාදන ලද 2005 මාර්තු 17 දාතම හා අංක 2172 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් ඒ වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : පාර නැගෙනහිරට : එම ඉඩමේ ලොට් සී දකුණට : එම ඉඩමේ ලොට් ඩී සහ බී සහ බස්නාහිරට : බිම් කානුව යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් තිස්පහයි දශම හතරයි බිංදුවක් (අ. 0 රූ. 0 පර්. 35.40) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන් ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ හා මාර්ග අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශතාවන් ද වෙනත් අයිතීන් ද ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරු අංක 2172 ට අනුව වෙළුම/පත්ඉරුව ජී 1621/89 හි හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

බලයලත් මානක තැන ඩී. කපුගීකියන යන අය විසින් සාදන ලද අංක 3611 දරන පිඹුරේ නිරූපිත ලොට් 6 මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10-1075/2

**සීමාසහිත සම්පත් බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ගිණුම් අංකය : 1069 5000 9589
ඩී. ජී. එස්. කුමාර

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2007 ක් වූ අගෝස්තු මස 30 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව බැඳුම්කර අංක 1291 ප්‍රකාර රුපියල් හාරලක්ෂ දාහතර දහස් පහළවයි ශත දහ අටක (රු. 414,015.18) මුදල ද, 2007 ජූනි මස 06 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හාරලක්ෂ හාරදහස් හයසිය විසිනමයයි ශත තිස්තුනක (රු. 404,629.33) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දාසයක් (16%) බැගින් වූ පොලිය ද, හා ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2008.08.08 වැනි දින *රජයේ ගැසට් පත්‍රයේ* 2008.07.29 වැනි දින දිවයින අයිලන්ඩ් සහ තිනකුරල් දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2009.11.14 දින පෙ. ව. 9.30 හි දී පිහිටි ස්ථානයේ දී මහනුවර බලයලත් වෙන්දේසිකරුවන් වන අයි. ඩබ්ලිව්. ජයසූරිය යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ හෝමාගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ හෝමාගම පිහිටි "උඩහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන පී. එච්. එම්. එල්. ප්‍රේමචන්ද්‍ර යන අය විසින් සාදන ලද 2005 අප්‍රේල් 27 දාතම හා අංක 4968 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කොට සීමා නිර්ණය කොට ලොට් සී වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් උතුරට : ඒ වන්නිආරච්චි විසින් හිමිකම් කියනු ලබන ඉඩම නැගෙනහිරට: ලොට් ඒ සහ බී දකුණට : ජගත් අනුර සහ ටී. දිල්රුක්ෂිකා යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ බස්නාහිරට : ජගත් අනුර සහ ඒ. සතරසිංහ යන අය විසින් හිමිකම් කියනු ලබන ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් පහළවයි දශම හයයි දෙකක් (අ. 0 රූ. 0 පර්. 15.62) විශාල ඉඩම් කොටස සමග පස ගහකොළ වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ හා මාර්ග අයිතීන් ද, වරප්‍රසාදයන් ප්‍රවශතාවන්, පරවශතාවයන් ද වෙනත් අයිතීන් ද ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී පිඹුරු අංක 4968 ට අනුව වෙලුම/පත්ඉරුව ජී. 1322/253 හි හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

10-1075/3

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ )

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

ගිණුම් අංක : 1014 5304 8023 සහ 0014 5000 8229

බී. කුමාරසේන

